ධම්මෝ හවේරක්ඛති ධම්මචාරී

සබ්බ පාපස්ස අකරණං
කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියෝදපනං
ඒතං බුද්ධාන සාසනං

# අන්තර්ගතය


1. නමස්කාරය, පන්සිල්, සහ තෙරුවන් වන්දනාව 2
2. වන්දනා ගාථා 4
3. අටවිසි ආහාර බුද්ධ පූජාව 6 සහ බෝධි වන්දනාව 7
4. අටවිසි බුද්ධ වන්දනාව 8
5. අටවිසි බුදුවරයන්ට වෙන් වෙන්ව ආහාර පූජා කිරීම 9
6. අටවිසි බුදුවරයන් වහන්සේලා වැදීම සහ සීවලි පූජාව 11
7. තෙරුවන් සරන ප්‍රාර්තනාව 12
8. පිරිත් දේශණා, මහා මංගල සූත්‍රය 13
9. රතන සූත්‍රය 15
10. කරණීය මෙත්ත සූත්‍රය 18
11. ධජග්ග පිරිත 19
12. ගිරිමානන්ද සූත්‍රය 23
13. අටවිසි පිරිත 29
14. ජය පිරිත 30
15. මාර පරාජය පිරිත 32
16. දස දිසා පිරිත 32
17. සීවලි පිරිත 33
18. මහා ජය මඩගල ගාථා 34
19. දෙවියන්ට පින්දීම සහ තෙරුවන් සමාකර ගැනීම 37
20. ප්‍රාර්තනා ගාථා 39


**සබ්බ පාපස්ස අකරණං - සියලු අකුසලින් දුරුවීම**
**කුසලස්ස උපසම්පදා - කුසල් කිරීම හා දියුණු කිරීම**
**සචිත්ත පරියෝදපනං - තමාගේ සිත පිරිසිදු කිරීම**
**ඒතං බුද්ධාන සාසනං - මේ සියළු බුදුවරයන්ගේ අනුශාසනයයි**

මෙහි අන්තර්ගත පිරිත් සූත්‍ර පිරුවානා පොත් වහන්සේ උපුටා ගනිමින් සකසා ඇත. භාවිතයේ පහසුව උදෙසා ව්‍යවහාරික සිංහල අක්ෂර වින්‍යාසය යොදාගෙන ඇත. නිවරදි උච්ඡාරණය සඳහා අදාල පිරිත් දේශණාවන් ශ්‍රවනය කරන ලෙසට පින් සිත් පෙරටුව ඉල්ලා සිටිමි.

අක්ෂර වින්‍යාසය අධ්‍යයනය සඳහා පිරුවානා පොත් වහන්සේ පරිශීලනය කරීමට කාරුණික වන්න.

මෙම ව්‍යායාමයට අතහිත දුන් සැමටත් ඔවුන් නමින් මිය පරලව ගියාවූ සියලු දෙනාටත්,
දිග, කෙටි, මහත, මධ්‍යම, විශාල, සියුම්, ශරීර ඇත්තෝ වූ ද, දිය ගොඩ වෙසෙන සියලු සත්තූහුද,
පෙනෙන, නොපෙනෙන, දුර, ළඟ, වෙසෙන සත්වයෝද, උපතට පැමිනි සහ උපතක් සොයන සත්තූහුද,
ඉපදීම අවසන් කල සත්තූහුද, ඇතුළු සියලු විශ්ව වාසීනට මෙම පිරිත් දේශණාවන්ගේ ආනුභාවයෙන්
පින් අනුමෝදන් වේවා සියල්ලෝම සැප ඇත්තෝ වෙත්වා, නීරෝගී වෙත්වා, සුවපත් වෙත්වා.

**දහම් පඬුරක් ලෙස, නොමිලේ බෙදාහැරීම පිණිසයි.**
**www.paritha.org**

# න ම ස් කා ර ය

## නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
## නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
## නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

භාග්‍යවත් වූ අරහත් වූ සම්‍යක් සම්බුදුරජානන් වහන්සේට මාගේ නමස්කාරය වේවා

## බුද්ධං සරණං ගච්ඡාමි
## ධම්මං සරණං ගච්ඡාමි
## සංඝං සරණං ගච්ඡාමි

පළමුව මම බුදුන් සරණ යමි දහම් සරණ යමි සඟුන් සරණ යමි

## දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
## දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
## දුතියම්පි සංඝං සරණං ගච්ඡාමි

දෙවනුව ද මම බුදුන් සරණ යමි දහම් සරණ යමි සඟුන් සරණ යමි

## තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
## තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
## තතියම්පි සංඝං සරණං ගච්ඡාමි

තෙවනුව ද මම බුදුන් සරණ යමි දහම් සරණ යමි සඟුන් සරණ යමි

# ප න් සි ල්

## පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි

ප්‍රානඝාතයෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදම් වෙමි

## අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි

සොරකම් කිරීමෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදම් වෙමි

## කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි

කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදම් වෙමි

## මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි

බොරුකීමෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදම් වෙමි

## සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි

සුරා පානයෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදම් වෙමි

# තෙරුවන් වන්දනාව

ඉතිපි සෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ විජ්ජාචරණ
සම්පන්නෝ සුගතෝ ලෝකවිදු අනුත්තරෝ පුරිසදම්මසාරථී
සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවා ති

නමාමි බුද්ධං ගුණ සාගරන්තං
සත්තා සදා හොන්තු සුඛී අවේරා
කායො ජිගුච්ජෝ සකලෝ දුගන්ධෝ
ගච්ඡන්ති සබ්බේ මරණං අහංච

ගුණ නම් වූ මහා සයුරේ පරතෙරට ගියාවූ සම්බුදුරජානන් වහන්සේ වඳිමි. සියලූ සත්වයෝ සියලු කල්හී සැප ඇත්තෝ වෙත්වා. වෛර නැත්තෝ වෙත්වා. මෙම කය පිළිකුල්ය දුගඳ ය අන් සියල්ලන්ම සේම මමද මරණයට පත්වෙමි.

ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ සන්දිට්ඨිකෝ අකාලිකෝ
එහිපස්සිකෝ ඕපනයිකෝ පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහී ති

නමාමි ධම්මං සුගතේන දේසිතං
සත්තා සදා හොන්තු සුඛී අවේරා
කායො ජිගුච්ජෝ සකලෝ දුගන්ධෝ
ගච්ඡන්ති සබ්බේ මරණං අහංච

බුදුරජානන් වහන්සේ විසින් දේශිත ගුණ සයුරක් බඳු වූ ශ්‍රී සද්ධර්මය වඳිමි. සියලූ සත්වයෝ සියලු කල්හී සැප ඇත්තෝ වෙත්වා. වෛර නැත්තෝ වෙත්වා. මෙම කය පිළිකුල්ය දුගඳ ය අන් සියල්ලන්ම සේම මමද මරණයට පත්වෙමි.

සුපටිපන්නෝ භගවතෝ සාවකසඞ්ඝෝ උජුපටිපන්නෝ භගවතො
සාවකසඞ්ඝෝ ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝෝ
සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝෝ
යදිදංචත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා ඒස භගවතෝ
සාවකසඞ්ඝෝ ආහුනෙය්‍යෝ පාහුනෙය්‍යෝ දක්ඛිණෙය්‍යෝ
අඤ්ජලිකරණීයෝ අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්සා ති

නමාමි සංඝං මුනිරාජ සාවකං
සත්තා සදා හොන්තු සුඛී අවේරා
කායො ජිගුච්ජෝ සකලෝ දුගන්ධෝ
ගච්ඡන්ති සබ්බේ මරණං අහංච

බුදුරජානන් වහන්ගේ ආර්ය සංඝරත්නය වඳිමි. සියලු සත්වයෝ සියලු කල්හී සැප ඇත්තෝ වෙත්වා.
වෛර නැත්තෝ වෙත්වා. මෙම කය පිළිකුල්ය දුගඳ ය අන් සියල්ලන්ම
සේම මමද මරණයට පත්වෙමි.

# වන්දනා ගාථා

## පහන් පූජා කිරීම

ඝනසාරප්ප දිත්තේන, දීපේන තමධංසිනා
තිලෝක දීපං සම්බුද්ධං, පූජයාමි තමෝ නුදං

## සුවඳ පූජා කිරීම

සුගන්ධිකාය වදනං, අනන්ත ගුණ ගන්ධිනා
සුගන්ධිනාහං ගන්ධේන, පූජයාමි තථාගතං

## මල් පූජා කිරීම

වණ්ණ ගන්ධ ගුණෝ පේතං, ඒතං කුසුම සන්තතිං
පූජයාමි මුනින් දස්ස, සිරිපාද සරෝරුහේ
පූජේමි බුද්ධං කුසුමේනනේන, පුඤ්ඤේන මේතේන ලභාමි මොක්ඛං
පුප්පං මිලායාති යථා ඉදං මේ, කායෝ තථායාති විනාසභාවං

## පැන් පූජා කිරීම

අනන්ත ඤාණෝ විමලෝ, දක්ඛිණෙයෙයෝ ගුණාකරෝ
පතිගණ්හාතු භගවා, දක්ඛිණෝදක මුත්තමං
සුගන්ධං සීතලං කප්පං, පසන්න මධුරං සුභං
පානීය මේතං භගවා, පතිගණ්හාතු මුත්තමං
අධිවාසේතු නෝ භන්තේ, පානීයං පරිකප්පිතං
අනුකම්පං උපාදාය, පතිගණ්හාතු මුත්තමං

## ගිලන්පස පූජා කිරීම

අධිවාසේතු නෝ භන්තේ, ගිලානපච්චයං ඉමං
අනුකම්පං උපාදාය, පතිගණ්හාතු මුත්තමං
ඨපෙත්වා ධාතු කායං යෝ, අධිට්ඨාය ජිනෝ අගා
නිබ්බානං තස්ස පූජේමි, ගිලාන පච්චයං ඉමං

## කැඳ පූජා කිරීම

අධිවාසේතු නෝ භන්තේ, තරලං පරිකප්පිතං
අනුකම්පං උපාදාය, පතිගණ්හාතු මුත්තමං

## කිරි ආහාර පූජා කිරීම

පරිසුද්දෝ ජවන්තේන, පායාසේන සුගන්ධිනා
භගවන්තං අරහන්තං, සන්ති ලාභාය පුජයේ

අධිවාසේතු නෝ භන්තේ, පායාසං පරිකප්පිතං
අනුකම්පං උපාදාය, පතිගණ්හාතු මුත්තමං

## ආහාර පූජා කිරීම

සම්මා සම්බුද්ධ නාමයෝ, තිලෝකේ පච්චයාරහෝ
සනාථො පතිගන්හාතු, දානංදානි සුපූජිතං

අධිවාසේතු නෝ භන්තේ, භෝජනං පරිකප්පිතං
අනුකම්පං උපාදාය, පතිගණ්හාතු මුත්තමං

## ව්‍යාඤ්ජන පූජා කිරීම

අධිවාසේතු නෝ භන්තේ, ව්‍යාඤ්ජනං පරිකප්පිතං
අනුකම්පං උපාදාය, පතිගණ්හාතු මුත්තමං

## රසකැවිලි පූජා කිරීම

අධිවාසේතු නෝ භන්තේ, ඛජ්ජකං පරිකප්පිතං
අනුකම්පං උපාදාය, පතිගණ්හාතු මුත්තමං

## පළතුරු පූජා කිරීම

අධිවාසේතු නෝ භන්තේ, ඵලා ඵලං පරිකප්පිතං
අනුකම්පං උපාදාය, පතිගණ්හාතු මුත්තමං

## බෙහෙත් පූජා කිරීම

අධිවාසේතු නෝ භන්තේ, භේසජ්ජං පරිකප්පිතං
අනුකම්පං උපාදාය, පතිගණ්හාතු මුත්තමං

## චතුමධුර පූජා කිරීම

අධිවාසේතු නෝ භන්තේ, චතුමධුරං පරිකප්පිතං
අනුකම්පං උපාදාය, පතිගණ්හාතු මුත්තමං

## අෂ්ඨවිධපාන පූජා කිරීම

අධිවාසේතු නෝ භන්තේ, අෂ්ඨපානං පරිකප්පිතං
අනුකම්පං උපාදාය, පතිගණ්හාතු මුත්තමං

## දැහැත් පූජා කිරීම

නාගවල්ලි දළු පේතං, චුණ්ණපූග සමායුතං
තාම්බූලං පතිගණ්හාතු, සතං පූජේමි දංපිනෝ

## ත්‍රිවිධරත්නයේ ආශීර්වාද ලබාගැනීම

ඉච්චේවමච්චන්ත නමස්සනීයං
නමස්සමානෝ රතනත්තයං යං
පුඤ්ඤාභිසන්ධං විපුලං අලත්ථං
තස්සානුභාවේන හතන්තරායෝ

## අටවිසි ආහාර බුද්ධ පූජාව පූජා කිරීම

තණ්හංකරාදයො බුද්ධා අට්ඨවීසතිනායකා
පටිගණ්හාතුමං සබ්බං පානීයං සාධු පූජිතං

තණ්හංකරාදයො බුද්ධා අට්ඨවීසතිනායකා
පටිගණ්හාතුමං සබ්බං භොජනං සාධු පූජිතං

තණ්හංකරාදයො බුද්ධා අට්ඨවීසතිනායකා
පටිගණ්හන්තුමං සබ්බං ව්‍යංජනං සාධු පූජිතං

තණ්හංකරාදයො බුද්ධා අට්ඨවීසතිනායකා
පටිගණ්හාතුමං සබ්බං ඛජ්ජකං සාධු පූජිතං

තණ්හංකරාදයො බුද්ධා අට්ඨවීසතිනායකා
පටිගණ්හාතුමං සබ්බං රසවන්තං ඵලා ඵලං

තණ්හංකරාදයො බුද්ධා අට්ඨවීසතිනායකා
පටිගණ්හාතුමං සබ්බං ගිලාන පච්චයං වරං

## සියලු පූජාවන් පූජාකිරීම

සේවිතං ධම්මරාජේන
පත්තං සම්බෝධිමුත්තමං
පූජේමි බෝධිරාජානං
සබ්බං සද්ධාය පූජිතං

## දඹදිව සැවැත්නුවර ආනන්ද බොධි වන්දනාව

සුරෝපිතං සුදත්තේන
සම්බුද්ධෙ නාපි සේවිතං
ආනන්ද බොධි නමෝයං
දුමින්දං සිරසා නමේ

# බෝධි වන්දනාව

මැද්ද දේසේ ඉර්දියෙන් වැඩි සිද්ද සිරිමහ බෝධි සාමිනි
අනුරපුර නුවරටත් වැඩලා ගුවන් සක්මන් කලයි සාමිනි
පොලව මිහිකත දිවැස් බලලා රනින් පලසක් මවා පෑමෙනි
නොදැන කළ පව් ගෙවා වඳිනට ආම් සිරි මහ බෝධි සාමිනි

අනුත්තර පුරිසාදි ගුණයෙන් පුදනු ලැබූ දෙව් බඹු විසින්
සුගත මුනි සිරිපා කමල් යුග අනඳ හිමි නැවූ ලෙසින්
දොහොත් මුදුනේ තබා වඳිමින් සුවඳ පැන් ඉස සිසිලසින්
අපිත් නාවමු අපේ සිරි මහ බෝ රජාණන් සන්තොසින්

සම්බුදු හිමිට සෙවනක් වුනු බෝරජුට
මේ මල් පුදන්නේ සමිඳුන්ගේ නමට
බුදු හිමි කියා දුන් ඒ මහ ගුණ කඳට
පළමුව වඳිමි බෝ සමිඳුන්ගේ  නමට

බුදු පුද ලබාගත් සොඳ මේ බෝ රුකට
මේ පුද කරන්නේ පිළියෙළ කර සොඳට
සියලුම අපල දුරු කරවා දෙන ලෙසට
සහනය සලසන්න බෝරජුනේ අපට

අන්තිම සැපයි බෝ සමිඳුගේ සෙවන මට
අප අසරණයි වෙන්නකො සමිඳුනි පිහිට
සියලුම අපල දුරු කරවා දෙන ලෙසට
වැඳ වැඳ කියමි පින් ඇති බෝ සමිඳුන්ට

දෙවියන් බඹුන් වඳිනා පුදනා බෝධී
කොපමණ වැඳුම් පිදුවත් මගෙ සිතට මදී
දැල්වෙන පහන් ආලෝකය සිතෙහි රැඳී
බුදුහිමි පෙනේවා දෙනෙතට බෝ මැඩදී

බෝ පත් පවන් සිලි සිලි හඬ ඇසෙන විට
මට සිහිවෙන්නෙ බෝ සමිඳුන්ගේ සතුට
සුදුවැලි තලාවේ බෝමැඩ සෙවන යට
තෙල් මල් පුදා වඳිනෙමි බෝ සමිඳුන්ට

බෝ සමිඳුන්ගෙ මහ ගුණ කඳ මෙනෙහි කොට
අපෙ දුක කියන්නේ සමිඳුගෙ සෙවන යට
සිසිලක් වෙලා අපෙ දුක නිවනා ලෙසට
අයදිමි නමැද මේ ලෙස බෝ සමිඳුන්ට

මද සුළඟට ලෙල දෙන බෝ පත් සෙවනේ
ඉඳගෙන කියමි මට පිහිටක් වන ලෙසිනේ
මහ මෙවුනා උයනෙ රෝපිත බෝ රජුනේ
මට සිසිලක් ගෙන දෙයි මේ බෝ සෙවනේ

සිලි සිලි හඬ ඇසෙන විට බෝ සෙවන යට
ගෙනදෙයි සිසිල සහනය අපෙ අපලයට
සිටිනා විටදි බෝ සමිඳුගෙ සෙවන යට
අපෙ දුක් නිවෙයි ලැබෙමින් සමිඳුගෙ පිහිට

බුදු හිමි නෙතින් පුද ලැබු මහ බෝ සමිඳේ
තේජස් බවක් ඇති බව වැටහෙයි නිබඳේ
පිහිටක් අයැද මා අද කරදර මැද්දේ
බෝ සමිඳුටයි අපෙ දුක කියලා වැන්දේ

## අටවිසි බුද්ධ වන්දනාව

දන් පින් බලයෙන් ලොව සෙත සෑදු, තන්හන්කර මුණි වඳිනෙමි සාදු
පාදන් පෙරහර බුදු බව සෑදු, මේදන්කර මුණි වඳිනෙමි සාදු
දරුවන් දන්දී මරුවන් පැරදු, සරණංකර මුණි වඳිනෙමි සාදු
මේ පන් දහසෙන් බුදුගුණ සෑදු, දීපන්කර මුණි වඳිනෙමි සාදු
පින් බලයෙන් ලොවිතුරු බවසෑදු, කොණ්ඩඤ්ඤය මුනි වඳිනෙමි සාදු
පින්කල සතහට මොක්සුව සෑදු, මංගල මුණි වඳිනෙමි සාදු
නිවන ලබාගන්නට මග සෑදු, සුමන මුනිඳු නමදිමි මම සාදු
පාමෙත සත හට මොක් මග සෑදු, රේවත මුණි රජ වඳිනෙමි සාදු
ලෝසත සසරින් ගොඩකර සෑදු, සෝභිත මුණි රජ වඳිනෙමි සාදු
දෙනෝ දහස් දෙනෙතට සෙත සෑදු, අනෝම දස්මුනි වඳිනෙමි සාදු
සුදට සුදේ බුදුරුස් ලොව විහිදු, පදුම මුනිඳු වඳිනෙමි නිති සාදු
බෝරද මුලදී මරසෙන් පැරදු, නාරද මුණි රජ වඳිනෙමි සාදු
හදවත් මොක් සිසිලෙන් නිති සේදු, පදුමුත්තර මුණි වඳිනෙමි සාදු
විවාද දුරුකොට මොක් මග සෑදු, සුමේද මුණි රජ වඳිනෙමි සාදු
නිවාත ගුණ ලොව ඇති කල සෑදු, සුජාත මුණි රජ වඳිනෙමි සාදු
බලවත් වී ආ මරබල පැරදු, පියදස්සී මුණි වඳිනෙමි සාදු
තිස්ස සුවය නිවනට මග පෑදු, අත්ථදස්සී මුණි වඳිනෙමි සාදු
ධම්ම බලයෙන් ලොව සුබසෙත සෑදු, ධම්මදස්සී මුණි වඳිනෙමි සාදු
බුදුපුත් ඇතිකොට ලොව සෙත සෑදු, සිදුහත් මුණි රජ වඳිනෙමි සාදු
ලක්ෂ ගනන් සත හට සෙත සෑදු, තිස්ස මුනිඳු වඳිනෙමි මම සාදු
රැස්ව සිටිය මර බලයෙන් පැරදු, ඵුස්ස මුනිඳු වඳිනෙමි මම සාදු

තපස්ගුණය ලොව සැම තැන පිහිටූ, විපස්සි මුණි රජ වඳිනෙම් සාදු
කිපි පැමිනි වසවත් බල පැරදු, සිඛී මුනිඳු වඳිනෙම් මම සාදු
තිස්සෙම සතහට මෙත්කල සාදු, වෙස්සභූ මුණි රජ වඳිනෙම් සාදු
ඉර සඳමෙන් ලොව බුදු බල විහිදු, කකුසඳ මුණි රජ වඳිනෙම් සාදු
පානා මොක් සිසි ලෙන් සෙත සෑදු, කෝනාගම මුණි වඳිනෙම් සාදු
විස්මිත බුදුබල ලොවටම විහිදු, කස්සප  මුණි රජ වඳිනෙම් සාදු
සව් සෙත වෙත මෙත් ගුණ පෑ සාදු, ගෞතම අප මුනි වඳිනෙම් සාදු

## අටවිසි බුදුවරුන්ට වෙන් වෙන්ව ආහාර පූජා කිරීමේ ගාථා

| | |
|---|---|
| **තණ්හංකරං** මහාවීරං | මහායසං ලෝකනාථං |
| මුනින්දං ලෝකනායකං | **මේධංකරං** විනායකං |
| හොජතෙනපි පූජේමි | හොජතෙනපි පූජේමි |
| ඛජ්ජකෙන එලෙන ච | ඛජ්ජකෙන එලෙන ච |
| | |
| දෙව දෙවං මහා වීරං | **පුතිණ්ධරං** මහානාගං |
| මෙහෙසිං **සරණංකරං** | **දීපංකරං** මහා මුණිං |
| හොජතෙනපි පූජේමි | හොජතෙනපි පූජේමි |
| ඛජ්ජකෙන එලෙන ච | ඛජ්ජකෙන එලෙන ච |
| | |
| මුනින්දං ජනපා මොක්ඛං | ලොකාලොකකරං සෙට්ඨං |
| **කොණ්ඩඤ්ඤං** ලොකපුජිතං | **මංගලං** පුරිසුත්තමං |
| හොජතෙනපි පූජේමි | හොජතෙනපි පූජේමි |
| ඛජ්ජකෙන එලෙන ච | ඛජ්ජකෙන එලෙන ච |
| | |
| සුමනාති **සුමනං** ධීරං | තිලොකදීපං සම්බුද්ධං |
| සම්බුද්ධං සුමනං ජිනං | **රෙවතං** රතිවඩ්ඪනං |
| හොජතෙනපි පූජේමි | හොජතෙනපි පූජේමි |
| ඛජ්ජකෙන එලෙන ච | ඛජ්ජකෙන එලෙන ච |
| | |
| ගුණාකරං මහාපුඤ්ඤං | **අනොමදස්සිං** සම්බුද්ධං |
| **සොභිතං** කරුණාධරං | ලොකනාථං ජනුතතමං |
| හොජතෙනපි පූජේමි | හොජතෙනපි පූජේමි |
| ඛජ්ජකෙන එලෙන ච | ඛජ්ජකෙන එලෙන ච |
| | |
| **එදුමා** නාම සම්බුද්ධං | සත්තසාරං මහාභිඤ්ඤං |
| ලොකනාථං ජනුතතමං | **නාරදං** ලොක නායකං |
| හොජතෙනපි පූජේමි | හොජතෙනපි පූජේමි |
| ඛජ්ජකෙන එලෙන ච | ඛජ්ජකෙන එලෙන ච |

මහාකාරුණිකං නාථං
මුනිඳං **පදුමුත්තරං**
හොජතෙනපි පූජේමි
ඛජ්ජකෙන ඵලෙන ච

ඹහාමතිං මහාතෙජං
**සුමේධං** නාම නායකං
හොජතෙනපි පූජේමි
ඛජ්ජකෙන ඵලෙන ච

**සුජාතං** සබ්බලොකගගං
චක්ඛු මනතං මහා මුනිං
හොජතෙනපි පූජේමි
ඛජ්ජකෙන ඵලෙන ච

අංගීරසං ජුතිමනතං
**පියදස්සිං** නාරාසභං
හොජතෙනපි පූජෙමි
ඛජ්ජකෙන ඵලෙන ච

**අත්ථදස්සිං** කාරුණිකං
මුනින්දං දීපදුත්ත මං
හොජතෙනපි පූජේමි
ඛජ්ජකෙන ඵලෙන ච

බ්‍රහමාති බ්‍රහ්මං පවරං
**ධම්මදස්සිං** තමෝනුදං
හොජතෙනපි පූජේමි
ඛජ්ජකෙන ඵලෙන ච

**සිදධත්ථං** පටිවිද්ධත්ථං
සබ්බලොකෙක නායකං
හොජතෙනපි පූජේමි
ඛජ්ජකෙන ඵලෙන ච

සත්ථාරං **තිස්ස** සම්බුද්ධං
සබබඤ්ඤුතං ලොක පූජිතං
හොජතෙනපි පූජේමි
ඛජ්ජකෙන ඵලෙන ච

මුනිඳං **ඵුස්ස** සම්බුද්ධං
මහිදධිං සුගුණාකරං
හොජතෙනපි පූජේමි
ඛජ්ජකෙන ඵලෙන ච

විජ්ජාචරණ සම්පන්නං
**විපස්සිං** විගතොපමං
හොජතෙනපි පූජේමි
ඛජ්ජකෙන ඵලෙන ච

**සිඛිං** නාම මහාවීරං
මෙහෙසිං ජින පුංගවං
හොජතෙනපි පූජේමි
ඛජ්ජකෙන ඵලෙන ච

ලොකවිදුං ලොකනාථං
**වෙස්සභූං** සුබදායකං
හොජතෙනපි පූජේමි
ඛජ්ජකෙන ඵලෙන ච

**කකුසන්ධං** සත්ථවාහං
මුනිඳං සුසමාහිතං
හොජතෙනපි පූජේමි
ඛජ්ජකෙන ඵලෙන ච

ඔහෙසිං කොණාගමනං
බුද්ධං දසවිලොචනං
හොජතෙනපි පූජේමි
ඛජ්ජකෙන ඵලෙන ච

**කස්සපං** නාම සම්බුද්ධං
මාරාරිං පුරිසුත්තමං
හොජතෙනපි පූජේමි
ඛජ්ජකෙන ඵලෙන ච

අංගීරසං භූරිපඤ්ඤං
**ගෞතමං** සක්‍යපුඞ්ගවං
හොජතෙනපි පූජේමි
ඛජ්ජකෙන ඵලෙන ච

# අටවිසි බුදුවරයන් වහන්සේලා වැඳීම

වන්දෙ තණ්හංකරං බුද්ධං
වන්දෙ මෙධංකරං මුනිං
සරණංකරං මුණි වන්දෙ
වන්දෙ දීපංකරං මුනිං

වන්දෙ කොණ්ඩඤ්ඤ සත්ථාරං
වන්දෙ මංගලං නායකං
වන්දෙ සුමන සම්බුද්ධං
වන්දෙ රෙවත නායකං

වන්දෙ සොභිත සම්බුද්ධං
අනොම දස්සිං මුනිං නමෙ
වන්දෙ පදුම සම්බුද්ධං
වන්දෙ නාරද නායකං

පදුමුත්තරං මුනිං වන්දෙ
වන්දෙ සුමේධං නායකං
වන්දෙ සුජාත සම්බුද්ධං
පියදස්සිං මුනිං නමෙ

අත්ථ දස්සිං මුනිං වන්දෙ
ධම්ම දස්සිං ජිනං නමෙ
වන්දෙ සිද්ධත්ථ සත්ථාරං
වන්දෙ තිස්ස මහා මුනිං

වන්දෙ ඵුස්ස මහාවීරං
වන්දෙ විපස්සිං නායකං
සිඛිං මහා මුනිං වන්දෙ
වන්දෙ වෙස්සභූ නායකං

කකුසන්ධං මුනිං වන්දෙ
වන්දෙ කොණාගම නායකං
කස්සපං සුගතං වන්දෙ
වන්දෙ ගෞතම නායකං

අට්ඨවීසති මෙබුද්ධා
නිබ්බානමතදායිනො
නමාමි සිරසා නිච්චං
තෙඛං රකඛනතු සබ්බදා

# සීවලි පූජාව

## සීවලි තෙරුන් වහන්සේට වැඳීම

පියං දේව මනුස්සානං, බ්‍රහ්මාණඤ්ච පියං තථා
පියං නාගසුපණ්ණානං, කතකිච්චං අනාසවං
ලාභිං ලභන්තං සබ්බත්ථ, වනෙ ගාමෙ ජලෙ ථලෙ
ලාභීනමග්ගතං පත්තං, කත්වාන කුසලං බහුං
ඡලභිඤ්ඤං මහාතෙජං, පභින්නපටිසම්භිදං
සුසීලං සීවලී ථෙරං, නමාමි සිරසාදරං

## මල් පිදීම

පියං දේව මනුස්සානං, කුසුමං ච මනෝහරං
සුසීලං සීවලී ථෙරං, පූජේමි කුසුමේන හං

## පහන් පිදීම

පියං දේව මනුස්සානං, කුසුමං ච මනෝහරං
සුසීලං සීවලී ථෙරං, දීපෙන පූජයාම හං

## සුවඳ දුම් පිදීම

පියං දේව මනුස්සානං, කුසුමං ච මනෝහරං

සුසීලං සීවලී ථෙරං, ධූපෙන පූජයාම හං

## ගිලන් පස පිදීම

පූජේමි අග්ගලාභිස්ස, සම්මාසම්බුද්ධසාසනේ
සීවලී ථෙර පාදස්ස, ගිලානපච්චයං ඉමං

## ආහාර පූජාව

සදාදෙවමනුස්සෙහි, උපනෙන්තස්ස පච්චයේ
සීවලී ථෙර පාදස්ස, පූජෙමි භොජන ඉමං

## තෙරුවන් සරණයි

බුදු බෝ මුල දෙසැට මිසදිටු නසා ලෝසතවෙත දයාවෙනි
මිහිරි බඹසර මිහිරි වදනින් දෙසු මුදු වදනින් අමාවැනි
සහම් සිව්සස දෙසා ලොව්තුරු නිවන පලකල බුදු පියාණනි
අපට බුදු ගුණ කියාපා වැඳ පුදන්නට අවසර ස්වාමිනි

ලෝබ දුරුකර මෝහ සිඳහැර අසම සම මහණැන වතාණනි
කාරුනික අසරණ සතුන් වෙත ලෝකගුරු සම්බුදු පියාණනි
දැත ඔසවා කරන බැතිපුද වඳිමි පිලිගනු මැන ස්වමිනි
අපව සසරින් මුදාලන්නට පිහිට වුන මගෙ බුදු පියාණනි

ලොවට යහපත පිණිස කටයුතු කරන්නට මගෙ සිත යෙදේවා
එයට සහයෝගයද අනුබල සැම උදව් නොඅඩුව ලැබේවා
සියලු ඒ මේ කුසල් බලයෙන් පාරමී දම් දියුණු වේවා
සාදු සාදු සදා සුන්දර අමානිවනෙහි මා ගැලේවා

රහත් බෝධිය පසේ බෝධිය ලොව්තුරා බුදුබවෙන් වේවා
සිතූ පැතු අයුරකින් මගඵල නිවන් සුවයේ මා ගැලේවා
සසරේදී යම් පමාවක් මට කිසිම හේතුවකින් නොවේවා
සාදු සාදු සදා සුන්දර නිවන් සුවයේ මා ගැලේවා

සම්මා සම්බුදු සරණ ගොසින් අපි බුදුරුව දැක දැක සැනසෙනවා
සම්මා සම්බුදු සරණ ගොසින් අපි බුදුගුණ සිත සිත සැනසෙනවා
සම්මා සම්බුදු සරණ ගොසින් අපි බුදුගුණ කිය කිය සැනසෙනවා
සම්මා සම්බුදු සරණ ගොසින් අපි සුන්දර නිවනට ලංවෙනවා

බුදුරුව දුටු මගේ දෙනෙතට විපතක් බුදුන් දකිනතුරු ඇති නොවේවා
බුදුගුණ කිව් මගේ මුවට විපතක් මතු සංසාරෙදීවත් ඇති නොවේවා
බුදුගුණ ඇසු මගේ සවනට විපතක් නිවන් දකින තුරු ඇති නොවේවා
බුදුගුණ කිය කිය බුදුන් වැන්ද මා සුන්දර නිවනට පැමිණේවා

# පිරිත් දේශණා

සමන්තා චක්කවාලේසු අත්‍රාගච්ඡන්තු දේවතා
සද්ධම්මං මුණිරාජස්ස සුණන්තු සග්ගමොක්ඛදං

පරිත්තස්සවන කාලෝ අයං පදං තා
පරිත්තස්සවන කාලෝ අයං පදං තා
පරිත්තස්සවන කාලෝ අයං පදං තා

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

# මහා මංගල සූත්‍රය

ඒවං මේ සුතං ඒකං සමයං භගවා
සාවත්ථියං විහරති ජේතවනෙ
අනාථපිණ්ඩිකස්ස ආරාමේ

මා විසින් මෙසේ අදන ලදී.
එකල එක් සමහයක
භාග්‍යවතුන්වහන්සේ අනේපිඩු
සිටුතුමා විසින් කරවන ලද
ජේතවනාරාමයෙහි වැඩ වසන
සේක.

අථ ඛෝ අඤ්ඤතරා දේවතා
අභික්කන්තාය රත්තියා
අභික්කන්ත වණ්ණා කේවල කප්පං
ජේතවනං ඕභාසෙත්වා
යේන භගවා තේනුපසංකමි
උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා
එකමන්තං අට්ඨාසි ඒකමන්තං
ඨිතා ඛෝ සා දේවතා
භගවන්තං ගාථාය අජ්ඣභාසි

එකල්හී එක්තරා දෙවියෙක් රාත්‍රිය
පෙරයම ගෙවීගිය කල්හී මැදියම
මහත්වූ ආලෝකයෙන් දෙව්රම්
වෙහෙර ස්වකීය ශරීර
ශෝභාවයෙන් බුබුළුවමින්
භාග්‍යවතුන්වහන්සේ වෙත එළැඹ
වැද එකත්පස්ව සිටිමින්
භාග්‍යවතුන්වහන්සේට
ගාථාවකින් මෙසේ කීහ.

බහූදේවා මනුස්සාච
මංගලානි අචින්තයුං
ආකංඛමානා සොත්ථානං
බෲහි මංගලමුත්තමං

මෙලොව පරලොව දෙක්හි සැප
කැමති බොහෝ දෙවියෝද,
මනුශ්‍යයයෝද, දෙලෝ වැඩ
සලසන මංගල කරුණු නම්
කවරෙක්දැයි සිතූහ. යහපතට
කැමති අපහට එම ධර්මය දෙසා
වදහල මැනවි යි පැවසීය.

අසේවනා ච බාලානං
පණ්ඩිතානං ච සේවනා
පූජා ච පූජනීයානං
ඒතං මංගලමුත්තමං

එකල් හී අප
භාග්‍යවතුන්වහන්සේ,
බාලයන් ඇසුරු නොකිරීමද,
පණ්ඩිතයන් ඇසුරද, පිදියයුත්තන්
පිදීමද, උතුම් මේ එක එකක්,
උතුම් මංගල කරුණු වේ යයිද

පතිරූපදේස වාසෝ ච
පුබ්බේච කතපුඤ්ඤතා

අත්තසම්මාපණිධි ච
ඒතං මංගලමුත්තමං

සුදුසු දෙස විසීමත්,
පෙර පින් ඇති බවත්,
සිත මැනවින් දහමෙහි
පිහිටුවීමත්, උතුම් මංගල
කරුණු වේ යයිද

බාහු සච්චඤ්ච සිප්පඤ්ච
විනයෝ ච සුසික්ඛිතෝ
සුභාසිතා ච යා වාචා
ඒතං මංගලමුත්තමං

බොහෝ ඇසූපිරූ දේ දැනීමද,
සිප් සතර හුරු බවද,
තුන්දොරෙහි හික්මුණු
සුශික්ෂිතබවද, යහපත් වදන් ඇති
බවද, උතුම් මංගල කරුණු වේ
යයිද

මාතා පිතූ උපට්ඨානං
පුත්තදාරස්ස සංගහෝ
අනාකුලා ච කම්මන්තා
ඒතං මංගලමුත්තමං

මව් පිය උවැටනද, අඹුදරු
පෝෂණයද, නිරවුල් කටයුතුද,
උතුම් මංගල කරුණු වේ යයිද

දානං ච ධම්මචරියා ච
ඤාතකානං ච සංගහෝ
අනවජ්ජානි කම්මානි
ඒතං මංගලමුත්තමං

දානය, දස කුසලයෙහි දැහැමි
හැසුරුම, නෑයනට සැලකීම,
පෙහෙවස් විසීම් ආදි නිවැරැදි
කටයුතුකිරීම, උතුම් මංගල
කරුණු වේ යයිද

ආරති විරති පාපා
මජ්ජපානා ච සඤ්ඤමෝ
අප්පමාදෝ ච ධම්මේසු
ඒතං මංගලමුත්තමං

මානසික වාචසික අකුශලයෙන්
දුරුවී, මත්පැනින් වැලකී, කුසල්
දහමෙහි අප්‍රමාදව සිහිනුවනින්
යුතුවීම, උතුම් මංගල
කරුණු වේ යයිද

ගාරවෝ ච නිවාතෝ ච
සන්තුට්ඨී ච කතඤ්ඤුතා
කාලේන ධම්මසවණං
ඒතං මංගලමුත්තමං

ගරු සරු නිහතමානී බවද, ලද
දෙයින් සතුටද, කෙළෙහිගුන
ඇතිබවද, සුදුසු කල්හි බණ
ඇසීමද උතුම් මංගල
කරුණු වේ යයිද

ඛන්තී ච සෝවචස්සතා
සමණානං ච දස්සනං
කාලේන ධම්ම සාකච්ඡා
ඒතං මංගලමුත්තමං

ඉවසීම, සුවච බව, උතුම් සඟ
ගුන දැකීම, සුසුසුකල්හී දහම්
සාකච්ඡාව, මේ උතුම් මංගල
කරුණු වේ යයිද

තපෝ ච බ්‍රහ්මචරියා ච
අරියසච්චානදස්සනං
නිබ්බාණසච්ඡිකිරියා ච
ඒතං මංගලමුත්තමං

තපසද, බඹසර හැසිරීමද,
චතුරාර්‍ය්‍යී සත්‍ය දැකීමද, නිවන්
සාක්ෂාත් කිරීමද, මේ උතුම්
මංගල කරුණු වේ යයිද

ඵුට්ඨස්ස ලෝකධම්මේහි
චිත්තං යස්ස න කම්පති
අසෝකං විරජං ඛේමං
ඒතං මංගලමුත්තමං

අටලෝ දහමෙහි නොසැලී
යමකුගේ සිත පවතීද, සෝ බිය
නැති රාගාදී රජස් නැතිව,
කාමයෝගාදීන්ගෙන් නිරුපද්‍රිත වූ
රහත් උතුමන්ගේ සිතෙහි
නොසැලෙන බවද උතුම් මංගල
කරුණු වේ යයිද

ඒතාදිසානි කත්වාන
සබ්බත්ථ මපරාජිතා
සබ්බත්ත සොත්ථිං ගච්ඡන්ති
තං තේසං මංගලමුත්තමං තී

මේ හැම ගුණදම් පුරා, හැම තැන නොපරදින, සියලු යහපත පිනිස පැමිණ යමෙක් කටයුතු කරයිද, ඔවුනට මේ උතුම් මංගල්‍යක්ම වේ යැයි දේශණාකල සේක.

ඒතේන සච්ච වජ්ජේන හෝතු තේ ජය මංගලම්

මේ උතම් පිරිතෙන්, ඒ පිරිතේ සත්‍යයේ බලයෙන් ඔබට ජය මංගල්‍යයක්ම වේවා.

# රතන සූත්‍රය

යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව අන්තලික්ඛේ
සබ්බේව භූතා සුමනා භවන්තු
අථෝ පි සක්කච්ච සුනන්තු භාසිතං

අහසෙහි පොළොවෙහි වසන යම් භූත කොටසක් වේද, අමුනුෂ්‍ය කොටසක් වේද ඒ සියල්ලෝම සතුටු සිත් ඇත්තෝ වෙත්වා, මේ සුබාෂිතය ද සතුටින් අසත්වා.

තස්මා හි භූතා නිසාමෙථ සබ්බෙ
මෙත්තං කරොථ මානුසියා පජාය

එහෙයින් මෙහි රැස්වූ සියළු භූතයිනි අමුනුෂ්‍යයිනි, මාගේ වචනය අසව්.

දිවා ච රත්තෝ ච හරන්ති යේ බලිං
තසමා හි නේ රක්ඛථ අප්පමත්තා

මිනිසුන් වෙත මෙත් පතුරවව්. ඔවුහු දිවා රෑ ඔබට පුදපඬුරු බලි බිලි දෙන හෙයින්, ඒ සැම රකිවු.

යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා
සග්ගේසු වා යං රතනං පණීතං
න නෝ සමං අත්ථි තථාගතේන
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

මේ මිනිස් ලෙව හෝ අන් කිනම් ලොවක යම් ධනයක් වේද, දෙව්ලොව හෝ අන් කිනම් ලොවක මහගු රුවනක් වේද, ඔවුන් අතරින් ලොවුතුරු බුදුන් හා සම උතුම් රුවනක් නැත්තේමය. ඒ හෙයින් බුදුරජුන් උතුම් රුවනකි, ඒ සැබෑ වචනයේ බලයෙන් යහපතක්ම වේවා.

ඛයං විරාගං අමතං පණීතං
යදජ්ඣගා සක්‍යමුනි සමාහිතෝ
න තේන ධම්මේන සමත්ථි කිඤ්චි
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

කෙලෙස් නසා රාගය දුරලා මරනින් තොර වූ  අමෘත වූ ඒ නිර්වානය පසක්කිරීමේ දහම මුනිඳුන් දෙසූසේක. ඒ දහම ට සම කිසිත් නැත්තේමය, මෙම නිවන් දහම උතුම් රුවනකි, මේ දහමේ සත්‍යානුභාවයෙන් සෙත් වේවා.

යං බුද්ධසෙට්ඨෝ පරිවණ්ණයි සුචිං
සමාධිමානන් තරිකඤ්ඤමාහු
සමාධිනා තෙන සමෝ න විජ්ජති
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

බුදුරජාණන් වහන්සේ විසින් වර්ණනා කළාවූ, ඒ පිවිතුරු සමාධිය හා අනතුරුවම ඵල දෙන මාර්ග ඵලයන්ට සම වූ අන්‍ය සමාධියක් නැත, මෙයද දහමෙහි උතුම් ගුණයකි, උතුම් රුවනකි, ඒ සත්‍යයේ බලයෙන් සෙත් වේවා.

යේ පුග්ගලා අට්ඨ සතං පසත්ථා
චත්තාරි ඒතානි යුගානි හොන්ති
තේ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා

සිව්සස්දම් දුටු සත් පුරුෂයන් විසින් පැසසු, දුර සිට ගෙනෙන පිදුම් ලැබුමට සුදුසු, උතුම් අෂ්ඨාර්ය

එතෙසු දින්නානි මහප්ඵලානි
ඉදම්පි සංඝෙ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

යේ සුප්පයුත්තා මනසා දළ්හේන
නික්කාමිනෝ ගෝතම සාසනම්හි
තේ පත්තිපත්තා අමතං විගය්හ
ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා
ඉදම්පි සංඝේ රතනං පණීතං
එතේන සච්චේන සුවත්ථි හෝතු

යථින්දඛීලෝ පඨවිංසිතෝ සියා
චතුබ්භි වාතේභි අසම්පකම්පියෝ
තථූපමං සප්පුරිසං වදාමි
යෝ අරියසච්චානි අවෙච්ච පස්සති
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

යේ අරියසච්චානි විභාවයන්ති
ගම්භීර පඤ්ඤේන සුදේසිතානි
කිඤ්චාපි තේ හොන්ති භුසප්පමත්තා
න තේ භවං අට්ඨමං ආදියන්ති
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

සහාවස්ස දස්සනසම්පදාය
තයස්සු ධම්මා ජහිතා භවන්ති
සක්කායදිට්ඨී විචිකිච්ජිතඤ් ච
සීලබ්බතං වා පි යදත්ථි කිඤ්චි
චතූහපායේහි ච විප්පමුත්තෝ
ඡ චා හි ඨානානි අභබ්බෝ කාතුං
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

කිඤ්චාපි සෝ කම්මං කාරෝති
පාපකං කායේන වාචා උද චෙතසා වා
අභබ්බො සෝ තස්ස පටිච්ඡාදාය
අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

පුද්ගල මහාසංඝරත්නයට දුන් දක්ෂිණාව මහත් ඵල වේමය, මේ කරුණින්ද බුද්ධ ශ්‍රාවක සංඝ කෙමේ උතුම් රුවනකි එම සඟගුණ බලයෙන් සෙත්වේවා.

යම් කෙනෙක් දිරිමත්ව නුවණින් සුගත් සසුනෙහි නික්ලේශීව අමෘත දහමට පැමින නිවන් සුව වළඳත්ද, මේ ද උතුම් සඟගුණයෙකි ඒ බලයෙන් සෙත්වේවා.

ස්ථිරව පොළොවෙහි සිටුවන ලද ඉන්ද්‍රඛීලයක් මෙන් සිව් දිගින් හමන සුළඟින් කම්පා නෙවන්නා, උතුම් සත් පුරුෂයෙකි, ඔහු සිව් දම් අවබෝධ කළ අයෙකි, සෝවාන් වූවෙකි. මේ කරුණින්ද ආර්‍ය්‍ය සංඝ තෙමේ උතුම් රුවනෙකි මේ සඟගුණයේ බලයෙන් සෙත්වේවා.

ගැඹුරු නුවණින් දෙසන ලද උතුම් සත්‍ය යමෙක් දැනගත්සේක්ද, ඒ සෝවාන් මඟට පත් උතුමා, පමා වුවද මිනිස් ලොව අටවැනිවරයටද නූපදියි. මේ කරුණින්ද ආර්‍ය්‍ය සංඝ තෙමේ උතුම් රුවනෙකි මේ සඟගුණයේ බලයෙන් සෙත්වේවා.

සෝවාන් මඟට පත්වීම සමග අත්හල යුතු දහම් තුනකි, සක්කායදිට්ඨියද, සීලබ්බත පරාමාසයද, විචිකිච්ඡාවද යන මේවා නැතිවේ, සිව් අපායෙන් මිදී අභව්‍ය ස්ථාන අටෙහි නූපදියි.

මෙයද ආර්‍ය්‍ය සංඝ තෙමේ සතු ගුණයෙකි, ඒ හේතු බලයෙන් සෙත්වේවා.

සෝවාන් මඟට පත්වූවකු ගෙන් කයින් වචනයෙන් සිතින් යම් වරදක් සිදු වූ වේ නම් එය සැඟවීමට නොහේ. මෙයද උතුම් සඟගුණයෙකි, ඒ හේතු බලයෙන් සෙත්වේවා.

වන ලැහැබ තුල ග්‍රීෂ්ම කාලයෙහි පූර්ව භාගයෙහි මල් පිපී ඇත්තේ යම් සේද, එසේ වූ නිවන් මග පමුණුවන උතුම් ධර්ම රත්නය පරමහිතාඛ්‍ය වූ නිවන් පිනිස බුදුරදුන් දෙසූ සේක. පරමහිත ඇති නිවන් මඟ මෙසේ දෙසූයෙන්, මෙයද උතුම් බුදු ගුණයෙකි, ඒ හේතු බලයෙන් සෙත්වේවා.

උතුම් ශ්‍රේෂ්ඨ දෙය දත්,

වනප්පගුම්බේ යතා ඵුස්සිතග්ගේ
ගිම්හානමාසේ පඨමස්මිං ගිම්හේ
තථූපමං ධම්මවරං අදේසයි
නිබ්බාණගාමිං පරමං හිතාය ඉදම්පි
බුද්ධේ රතනං පණීතං ඒතේන
සච්චේන සුවත්ථි හෝතු

උතුම් වූ නිවන් මග පෙන්වූ, මේ උතුම් දහම දෙසීමද, බුද්ධ රත්නයේ උතුම් ගුණයෙකි. ඒ සත්‍යය වචනයේ බලයෙන් සෙත්වේවා.

වරෝ වරඤ්ඤු වරදෝ වරාහරෝ
අනුත්තරෝ ධම්මවරං අදේසයි
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

රැස්කළ පැරණි දේ නැත පුරාතන කර්ම රහත් මගින් ක්ෂීන කලාවූද, යලි අලුතින් එක් කිරීමකුදු නැත්තාවූද, මතු භවයක් කෙරෙහි ඇලීමකුදු නැතිවූද, නැවත නොවැඩෙන සේ හීනවූ කෙලෙස් ඇති, ධෛර්‍යසම්පන්නවූ ඒ රහත් උතුමෝ, මේ පහන් නිවුනා සේ නිවීයත්ද, අවසන් සිත් නිරුද්ධ වීමෙන් පිරිනිවෙත් සේ සලකමි.

ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං
විරත්තචිත්තා ආයතිකේ භවස්මිං
තේ ඛීණබීජා අවිරූළ්හිච්ඡන්දා
නිබ්බන්ති ධීරා යථා යං පදීපෝ
ඉදම්පි සංඝෙ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

ඒ හෙයින් ආර්‍ය සංඝ තෙමේ උතුම් රුවනකි, ඒ හේතු බලයෙන් සෙත්වේවා.

අහසෙහි පොළොවෙහි වසන මෙහි රැස්වූ සියලු භූතයෝ ද, අමුනුෂ්‍යයෝ ද, දෙවියෝ ද, මිනිසුන් විසින් ද, පුදන ලද තථාගතයන් වහන්සේ නමදිමු ඒ හේතුවෙන් සැම සත්ව ප්‍රජාවටම සෙත්වේවා.

යානීධ භූතානි සමාගතානි
භුම්මානි වායා නිව අන්තලික්ඛේ
තථාගතං දේවමනුස්ස පූජිතං බුද්ධං
නමස්සාම සුවත්ථි හෝතු යානීධ
භූතානි සමාගතානි භුම්මානි වායා නිව
අන්තලික්ඛෙ තථාගතං දේවමනුස්ස
පූජිතං ධම්මං නමස්සාම සුවත්ථි
හෝතු යානීධ භූතානි සමාගතානි
භුම්මානි වායා නිව අන්තලික්ඛෙ
තථාගතං දේවමනුස්ස පූජිතං සංඝං
නමස්සාම සුවත්ථි හෝතු

අහසෙහි පොළොවෙහි වසන මෙහි රැස්වූ සියලු භූතයෝ ද, අමුනුෂ්‍යයෝ ද, දෙවියෝ ද, මිනිසුන් විසින් ද පුදන ලද, බුදධාදීන් විසින් අවබෝධ කර දේශනා කරනලද සද්ධර්මය නමදිමු. ඒ හේතුවෙන් සැම සත්වයෙකුටම සෙත්වේවා.

අහසෙහි පොළොවෙහි වසන මෙහි රැස්වූ සියලු භූතයෝ ද, අමුනුෂ්‍යයෝ ද, දෙවියෝ ද, මිනිසුන් විසින් ද, පුදන ලද තථාගත වූ සංඝයා වහන්සේ නමදිමු. ඒ හේතුවෙන් සැම සත්වයෙකුටම සෙත්වේවා.

ඒතේන සච්ච වජ්ජේන සබ්බ රෝග විනස්සතු
ඒතේන සච්ච වජ්ජේන සබ්බ භය විනස්සතු
ඒතේන සච්ච වජ්ජේන සබ්බ දුක්ඛ විනස්සතු

මේ උතම් පිරිතෙන් ඒ පිරිතේ සත්‍යයේ බලයෙන් සියළු රෝග, සියළු භය, සියළු දුක්, සැනෙකින් දුරුවී ඔබට නිරන්තර සුවයක් සහ ශාන්තියක්ම වේවා.

# කරණීය මෙත්ත සූත්‍රය

කරණීයමත්ථ කුසලේන
යං තං සන්තං පදං අභිසමෙච්ච
සක්කෝ උජූ ච සූජූච
සුවචෝ චස්ස මුදු අනතිමානි

සන්තුස්සකෝ ච සුභරෝ ච
අප්පකිච්චෝ ච සල්ලහුකවුත්ති
සන්තින්ද්‍රියෝ ච නිපකෝ ච
අප්පගබ්භෝ කුලේසු අනනුගිද්ධෝ

න ච ඛුද්දං සමාචරේ කිඤ්චි
යේන විඤ්ඤු පරේ උපවදෙය්‍යුං
සුඛිනෝ වා ඛෙමිනෝ හොන්තු
සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා

යේ කේචි පාණභූත ත්ථි
තසා වා ථාවරා වා අනවසේසා
දීඝා වා යේ මහන්තාවා
මජ්ඣිමා රස්ස කාණුකථූලා

දිට්ඨා වා යේව අද්දිට්ඨා
යේ ච  දූරේ වසන්ති අවිදූරේ
භූතා වා සම්භවේසී වා
සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා

න පරෝ පරං නිකුබ්බේථ
නා තිමඤ්ඤේථ කත්ථචි නං කඤ්චි
බයාරෝසනා පටිඝසඤ්ඤා
නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය

මාතා යථා නියං පුත්තං
ආයුසා ඒකපුත්ත මනුරක්ඛේ
ඒවම්පි සබ්බ භූතේසු
මානසං භාවයේ අපරිමාණං

මෙත්තං ච සබ්බලෝකස්මිං
මානසං භාවයේ අපරිමාණං
උද්ධං අධෝ ච තිරියං ච
අසම්බාධං අවේරං අසපත්තං

උතුම් ශාන්තිපද සංඛ්‍යාත නිර්වාණයක් වේද එය අවබෝධකොට වසනු කැමති අභිවෘද්ධිය සලසා ගැනීමට කැමති පුද්ගලයා විසින් කළයුතු පිලිවෙත් මගක් වෙයි.

ඔහු නිවන් අවබෝධය පිනිස වත් සමාදම් වීමට, පිලිපැදීමට දක්ෂ වන්නේය. හුදු මහත් කටයුතුවල හැකිබවද ඍජු බව මෙන්ම, මනා ඍජු බවද ඇත්තේය. සුවච බවද, මෘදු බවද, මනා නිහතමානී බවද, ඇතිකරගතයුත්තේය.

ලද දෙයින් තුටුවීමද, පහසුවෙන් පෝෂණයට හැකිවීමද, අල්ප කෘත්‍යතාවයද, සැහැල්ලු පැවතුම් ඇතිබවද, සන්සුන් ඉඳුරන් ඇති බවද, උතුම් නුවණද කඩිසරබවද, ගිහිගෙවල අනිසි නොඇල්මද, තිබිය යුතුයි. හැඩි දැඩි අසංවර ගති මෙන්ම කුලයන් කෙරෙහි නොඇලුනෙක් වන්නේය.

නුවණැති අන්‍යයන්ගේ අවමානයට ලක්වන කුඩා දෙයකුදු නොකරන්නේය. සියලුම සත්වයෝ සැප ඇත්තෝ වෙත්වා භය නැත්තෝ වෙත්වා. සුඛිත සිත් ඇත්තෝ වෙත්වා.

තෘෂ්ණා භය නිසා තැතිගන්නා වූ ද, තෘෂ්ණා භය නොමැති හෙයින් ස්ථාවර වූ ද, දිග, කෙටි, මහත, මධ්‍යම, විශාල, සියුම් ශරීර ඇත්තෝ ද, සියලු දිය ගොඩ වෙසෙන හැම සත්තුහූද, පෙනෙන, නොපෙනෙන, දුර, ළඟ, වෙසෙන සත්හූද, උපතට පැමිනි සහ උපතක් සොයන සත්තුහූද, ඉපදීම අවසන් කල සත්තුහූද, සියල්ලෝම සැප ඇත්තෝ වෙත්වා.

කෙනෙකු තව කෙනෙකුට වංචා නොකරත්වා, අවමන් නොකරත්වා, කෝපයෙන්, ද්වේශයෙන්, කටයුතු නොකරත්වා, අන් අයගේ දුක් කැමති නොවේවා.  කය වචනය පිලිබඳ විකෘතියෙන් ද මනෝව්‍යාකූලත්වයෙන් ද කෙනෙකු තව කෙනෙකුට දුකක් නොවේවා.

සිය පණ මෙන් රකින, එක පුතු ඇති මව මෙන්, සියලු සත්වයන් කෙරෙහි අප්‍රමාණ වූ මෛත්‍රිය පතුරත්වා.

උඩටද, යටටද, හරහටද, හැම දෙයට ඇති බාධා, හිරිහැර, වෛර චේතනා, කරදර, නැතිවන සේ, සැම සත වෙත මෛත්‍රිය  පතුරත්වා.

තිට්ඨං චරං නිසින්නෝ වා
සයානෝවා යාවතස්ස විගතමිද්ධෝ
ඒතං සතිං අධිට්ඨෙය්‍ය
බ්‍රහ්මමේතං විහාරං ඉධමාහු

දිට්ඨිං ච අනුපගම්ම සීලවා
දස්සනේන සම්පන්නෝ
කාමේසු විනෙය්‍ය ගේධං
නහි ජාතු ගබ්බසෙය්‍යං පුනරේති ති

සිටගෙනද, ඇවිදිමින්ද, සයනයකරමින්ද, අවදියෙන්ද, සැම කල්හී මේ මෛත්‍රී සහගත සිහියෙන්ම යුතු වෙත්වා. මෙය බුද්ධ ශාසනයේ ශ්‍රේෂ්ඨ විහරණය වේ.

මිත්‍යා දෘෂ්ඨියට නොපැමින, උතුම් දැක්මෙන් යුක්තව, වස්තු කාමයෙහි නොඇලී ජීවිතය ගෙවන්නා, යලි උපතට නොපැමිණේ, ඉපිද රහත් බවට පැමිණ නිවන්මගට පැමිණ පිරිනිවන් පාන්නේය.

ඒතේන සච්ච වජ්ජේන සබ්බ රෝග විනස්ස්තු
ඒතේන සච්ච වජ්ජේන සබ්බ භය විනස්ස්තු
ඒතේන සච්ච වජ්ජේන සබ්බ දුක්ඛ විනස්ස්තු

මේ උතම් පිරිතෙන් ඒ පිරිතේ සත්‍යයේ බලයෙන් සියළු රෝග, සියළු භය, සියළු දුක්, සැනෙකින් දුරුවී ඔබට නිරන්තර සුවයක් සහ ශාන්තියක්ම වේවා.

# ධජග්ග පිරිත

එවං මේ සූතං, ඒකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමේ තත්‍ර බෝ භගවා භික්ඛූ ආමන්තේසි භික්ඛවෝ ති භදන්තේ  ති තේ භික්ඛූ භගවතෝ පච්චස්සොසුං භගවා ඒත දවෝච.

මා විසින් මෙසේ අසන ලදී. එකල එක් සමයක භාග්‍යවතුන්වහන්සේ අනේපිඩු සිටුතුමා විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක. එකලහී භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රනය කල සේක. ස්වාමිනී භාග්‍යවතුන්වහන්ස යි භික්ෂූන් පිලිවදන් දූන්හ.
එකල හී භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළ සේක.

භූතපුබ්බං භික්ඛවේ දේවාසුරසඞගාමෝ සමුපබ්බූළ්හෝ අහෝසි. අථ බෝ භික්ඛවේ  සක්කෝ දේවානමින්දෝ දේවේ තාවතිංසේ ආමන්තේසි.

මහණෙනි පෙර වූ දෙයක් කියමි. දෙවියන් සහ අසුරයන් අතර සංග්‍රාමයක් විය. මහණෙනි ඉක්බිති සක්දෙවි රජ තෙමේ තව්තිසා වැසි දෙවියන් ඇමතීය

සචේ මාරිසා දේවානං සඞගාමගාතානං උප්පජ්ජේය්‍ය භයං වා ඡම්භිතත්තං වා ලෝමහංසෝ වා මමේව තස්මිං සමයේ ධජග්ගං උල්ලොකෙය්‍යාථ, මමංහිවෝ ධජග්ගං උල්ලෝකයතං, යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලෝමහංසෝ වා සෝ පහීයිස්සති.

නිදුකාණෙනි යුද්ධයට ගිය දෙවියන්ට යම් බියක් හෝ තැතිගැන්මක් හෝ ලොමුදැහැගැන්මක් හෝ උපන්නේනම් ඒ සමයෙහි මාගේම ධ්වජාග්‍රය බලව්. මාගේම ධ්වජාග්‍රය බලන්නාවූ තොපට යම් බියක් හෝ තැතිගැන්මක් හෝ ලොමුදැහැගැන්මක් හෝ වේ නම් එය දුරුවන්නේය.

නෝ චේ මේ ධජග්ගං උල්ලොකෙය්‍යාථ අථ පජාපතිස්ස
දේවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ, පජාපතිස්ස හි වෝ
දේවරාජස්ස ධජග්ගං උල්ලෝකයතං යං භවිස්සති භයං වා
ඡම්භිතත්තං වා ලොමහංසෝ වා සෝ පහීයිස්සති.

ඉදින් මාගේ ධ්වජාග්‍රය නොදකින්නේ නම් ඉක්බිති ප්‍රජාපතී නම් දෙව්රජ ගේ ධ්වජාග්‍රය බලව. ප්‍රජාපතී නම් දෙව්රජු ගේ ධ්වජාග්‍රය දක්නාවූ තොපට යම් බියක් හෝ තැතිගැන්මක් හෝ ලොමුදැහැගැන්මක් හෝ වේ නම් එය පහවන්නේය.

නෝ චේ පජාපතිස්ස දේවරාජස්ස ධජග්ගං උල්ලෝකෙය්‍යාථ.
අථ වරුණස්ස දේවරාජස්ස ධජග්ගං උල්ලෝකෙය්‍යාථ.
වරුණස්ස හි වෝ දේවරාජස්ස ධජග්ගං උල්ලොකයතං, යං
භවිස්සති භයං වා ඡම්භිතත්තං වා
ලෝමහංසෝ වා සෝ පහීයිස්සති.

ඉදින් ප්‍රජාපතී නම් දෙව්රජු ගේ ධ්වජාග්‍රය නො දක්නාහු නම් ඉක්බිති වරුණ නම් දෙව්රජු ගේ ධ්වජාග්‍රය බලව. වරුණ නම් දෙව්රජු ගේ ධ්වජාග්‍රය දක්නාවූ තොපට යම් බියක් හෝ තැතිගැන්මක් හෝ ලොමුදැහැගැන්මක් හෝ වේ නම් එය පහවන්නේය.

නෝ චේ වරුණස්ස දේවරාජස්ස ධජග්ගං
උල්ලොකෙය්‍යාථ. අථ ඊසානස්ස දේවරාජස්ස ධජග්ගං
උල්ලෝකෙය්‍යාථ. ඊසානස්ස හි වෝ දේවරාජස්ස ධජග්ගං
උල්ලෝකයතං, යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා
ලෝමහංසො වා සෝ පහීයිස්සති.

ඉදින් වරුණ නම් දෙව්රජු ගේ ධ්වජාග්‍රය නො දක්නාහු නම් එකල්හී ඊසාන නම් දෙව්රජු ගේ ධ්වජාග්‍රය බලව. ඊසාන නම් දෙව්රජු ගේ ධ්වජාග්‍රය දක්නාවූ තොපට යම් බියක් හෝ තැතිගැන්මක් හෝ ලොමුදැහැගැන්මක් හෝ වේ නම් එය පහවන්නේය.

තං ඛෝ පන භික්ඛවේ සක්කස්ස වා දේවානමින්දස්ස
ධජග්ගං උල්ලෝකයතං. පජාපතිස්ස වා දේවරාජස්ස ධජග්ගං
උල්ලෝකයතං, වරුණස්ස වා දේවරාජස්ස ධජග්ගං
උල්ලෝකයතං, ඊසානස්ස වා දේවරාජස්ස ධජග්ගං
උල්ලෝකයතං, යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා
ලෝමහංසෝ වා සෝ පහීයේථාපි නෝ පි පහීයේථ,
තං කිස්ස හේතු.

මහණෙනි සක්දෙව් රජු ගේ ධ්වජාග්‍රය බලන්නහුට හෝ, ප්‍රජාපතී දෙව් රජු ගේ ධ්වජාග්‍රය බලන්නහුට හෝ, වරුණ දෙව් රජු ගේ ධ්වජාග්‍රය බලන්නහුට හෝ, ඊසාන දෙව් රජු ගේ ධ්වජාග්‍රය බලන්නහුට හෝ, යම් බියක් හෝ තැතිගැන්මක් හෝ ලොමුදැහැගැන්මක් හෝ වේද හෙතෙම එයින් දුරුවන්නේ හෝ වෙයි, දුරුනොවෙන්නේ හෝ වෙයි. එයට හේතු කවරේද යත්.

සක්කෝ භික්ඛවේ දේවානමින්දෝ අවීතරාගෝ අවීතදෝසෝ
අවීතමෝහෝ භිරුච්ඡම්භි උත්‍රාසි පලායී ති.

මහණෙනි සක්දෙව් රජුතෙමේ දුරු නොකළ රාග ඇත්තේය, දුරු නොකළ ද්වේෂ ඇත්තේය, දුරු නොකළ මෝහ ඇත්තේය, බියවන සුලුය, තැතිගන්නා සුලුය, ලොමුදැහැගන්නා සුලුය, පලා යන සුලුය.

අහං ච ඛෝ භික්ඛවේ ඒවං වදාමි. සචේ තුම්හාකං භික්ඛවේ
අරඤ්ඤගතානං වා රුක්ඛමූල ගතානං වා සුඤ්ඤාගාරගතානං
වා උප්පජ්ජෙය්‍ය භයං වා ඡම්බිතත්තං වා ලෝමහංසෝ වා
මමේව තස්මිං සමයේ අනුස්සරෙය්‍යාථ

මහණෙනි මම තොපට මෙසේ කියමි, මහණෙනි ඉදින් ආරණ්‍යගත
වූයේ හෝ රුක්ෂමූලයකට ගියේ හෝ ශූන්‍යාගාරයකට ගියා වූ හෝ තොපට යම් බියක් හෝ
තැතිගැන්මක් හෝ ලොමුදැහැගැන්මක් හෝ උපන්නේ නම් එකල්හි මා මෙසේ සිහිකරව්.

ඉතිපි සෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ විජ්ජාචරණ
සම්පන්නෝ සුගතෝලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්මසාරථී
සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවා ති

ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කරුනෙනුද අරහත්ය, සම්යක් සම්බුද්ධය, විජ්ජාචරණ ධර්මයන්ගෙන්
සම්පන්නය, සුගතය, ලෝකවිදූය, අනුත්තරය, පුරිසදම්ම සාරථීය, සියලු දෙව් මිනිසුන්ට අනුශාසකය
බුද්ධය, භගවත්ය.

මමං හි වෝ භික්ඛවේ අනුස්සරතං යං භවිස්සති භයං වා
ඡම්භිතත්තං වා ලොමහංසෝ වා සෝ පහීයිස්සති

මහණෙනි මෙසේ මා සිහිකරන්නාවූ තොපට  යම් බියක් හෝ තැතිගැන්මක් හෝ ලොමුදැහැගැන්මක්
හෝ උපන්නේ නම් ඒ සියල්ල දුරුවේ.

නො චේ මං අනුස්සරෙය්‍යාථ අථ ධම්මං අනුස්සරෙය්‍යාථ

ඉදින් මා සිහිනොකෙරෙව් නම්, ඉක්බිති ධර්මය මෙසේ සිහිකරව්,

ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ සන්දිට්ඨිකෝ අකාලිකෝ
එහිපස්සිකෝ ඔපනයිකෝ පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහී ති
ධම්මංහි වෝ භික්ඛවේ අනුස්සරතං යං භවිස්සති භයං වා
ඡම්භිතත්තං වා ලෝමහංසෝ වා සෝ පහීයිස්සති

ඒ භාග්‍යවතුන් වහන්සේ මනාලෙස දේශණාකල ධර්මය සන්දෘෂ්ඨිකය, කල් නොයවා විපාක දෙන්නේය,
පැමින බැලීම සදහා සුදුසුය, එළඹීමට සුදුසුය, තම තමන් කෙරෙහි ලා නුවණැත්තන් විසින් දතයුත්තේය.
මහණෙනි මෙසේ ධර්මයහි ගුණ සිහිකරන්නාවූ තොපට  යම් බියක් හෝ තැතිගැන්මක් හෝ
ලොමුදැහැගැන්මක් හෝ උපන්නේ නම් ඒ සියල්ල දුරුවේ.

නො චේ ධම්මං අනුස්සරෙය්‍යාථ අථ සඞ්ඝං අනුස්සරෙය්‍යාථ

ඉදින් ධර්මයහි ගුණ සිහිනොකෙරෙව් නම්, ඉක්බිති සඟුන් මෙසේ සිහිකරව්.

සුපටිපන්නෝ භගවතෝ සාවකසඞ්ඝෝ උජුපටිපන්නෝ භගවතො
සාවකසඞ්ඝෝ ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝෝ
සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝෝ
යදිදංචත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා ඒස භගවතෝ
සාවකසඞ්ඝෝ ආහුනෙය්‍යෝ පාහුනෙය්‍යෝ
දක්ඛිණෙය්‍යෝ අඤ්ජලිකරණීයෝ අනුත්තරං
පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්සා ති

ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙමේ මනාව පිළිපන්නේය, ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙමේ සෘජු වූ පිළිවෙතින් යුක්තය, ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙමේ නිවන් සඳහා පිලිපන්නේය, ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙමේ ත්‍රී ශික්ෂාවෙහි ගරු කිරීමට සුදුසු පිළිවෙත් පිළිපන්නේය, යම් මේ පුරුෂ යුගල වශයෙන් සතර කොටසක් වෙත්ද, පුරුෂ පුද්ගල වශයෙන් අට දෙනෙක් වෙත්ද, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙමේ දුරිනිදු ගෙන හැර දිය යුතු ප්‍රත්‍යයට සුදුසුය, ප්‍රත්‍යයන් පිළිගැනීමට සුදුසුය, දක්ෂිණාවට සුදුසුය, දොහොත් මුදුන් දී වැදීමට සුදුසුය, සියලු ලෝකයාට උතුම් වූ පින් කෙතකි.

## සඞ්ඝං හි වෝ භික්ඛවේ අනුස්සරතං යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලෝමහංසෝ වා සෝ පහීයිස්සති තං කිස්ස හේතු

මහණෙනි මෙසේ සංඝයාගේ ගුණ සිහිකරන්නාවූ තොපට යම් බියක් හෝ තැතිගැන්මක් හෝ ලොමුදැහැගැන්මක් හෝ උපන්නේ නම් ඒ සියල්ල දුරුවේ. එයට හේතු කවරේද යත්.

## තථාගතෝ භික්ඛවේ අරහං සම්මා සම්බුද්ධෝ වීතරාගෝ වීතදෝසෝ වීතමෝහෝ අභීරූ අච්ඡම්භි අනුත්‍රාසි අපලායී ති

මහණෙනි අරහත් වූ, සම්‍යක් සම්බුද්ධ වූ, තථාගත තෙමේ, දුරු කරන ලද රාග ඇත්තේය, දුරු කරන ලද ද්වේෂ ඇත්තේය, දුරු කරන ලද මෝහ ඇත්තේය, බියනොවන සුලුය, තැතිනොගන්නා සුලුය, ත්‍රාස නොවන සුලුය, බියෙන් පලා නොයන්නේය.

## ඉදමවෝච භගවා ඉදං වත්වා සුගතෝ අථාපරං ඒතදවෝච සත්ථා

භාග්‍යවත් තෙමේ මේ ධජග්ග පිරිත වදාළේය, සුගත වූ ශාස්තෲන්වහන්සේ මෙය වදාරා නැවත මෙසේ වදාළ සේක.

## අරඤ්ඤේ රුක්ඛමූලේ වා සුඤ්ඤාගාරේව භික්ඛවෝ අනුස්සරේථ සමබුද්ධං භයං තුම්හාක නෝ සියා

මහණෙනි ආරණ්‍යයෙහි හෝ රුක්මූලයන හෝ ජනශුන්‍ය ස්ථානයක හෝ සම්බුදුන් සිහිකරව්, එකල්හි තොපට බියක් නොවන්නේය.

## නෝ චේ බුද්ධං සරෙය්‍යාථ ලෝකජෙට්ඨං නරාසභං අථ ධම්මං සරෙය්‍යාථ නීයාණිකං සුදේසිතං

ලොවට ජ්‍යෙෂ්ඨ වූ බුදුරජානන් වහන්සේ සිහි නොකරත්නම් එකල්හි නෛර්යාතාක වූ මනා සේ දෙසන ලද ධර්මය සිහිකරව්.

## නෝ චේ ධම්මං සරෙය්‍යාථ නීයාණිකං සුදේසිතං අථ සඞ්ඝං සරෙය්‍යාථ පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං

නෛර්යාතාක වූ මනා සේ දෙසන ලද ධර්මය නොකරත්නම් ඉක්බිති පින් කෙතක් වූ අනුත්තර වූ සංඝයා සිහිකරව්.

## ඒවං බුද්ධං සරන්තානං ධම්මං සඞ්ඝඤ්ච භික්ඛවෝ භයං වා ඡම්භිතත්තං වා ලෝමහංසෝ න හෙස්සතී ති

මහණෙනි මෙසේ බුදුරජානන් වහන්සේ ද, ධර්මය ද, සංඝයා ද, සිහිකරන්නවුන්ට බියක් හෝ, තැතිගැන්මක් හෝ, ලොමුදැහැගැන්මක් හෝ නොවන්නේය.

# ගිරිමානන්ද සූත්‍රය

ඒවං මේ සුතං, ඒකං සමයං භගවා සාවත්ථියං විහරති
ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමේ.
තේන ඛෝ පන සමයේන ආයස්මා ගිරිමානන්දෝ
ආබාධිකෝ හෝති දුක්ඛිතෝ බාළ්හගිලානෝ.

මා විසින් මෙසේ අසන ලදී එකල එක් සමයක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර ජේතවනයෙහි
අනාථ පිණ්ඩිකස්ස අනේපිඩු මහා සිටානන්ගේ ආරාමයෙහි වැඩ වසන සේක එ සමයෙහි
ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිරයන් වහන්සේ ආබාධිතව දුකට පත්ව දැඩි ලෙස ගිලන් වූයේ වෙයි

අථ ඛෝ ආයස්මා ආනන්දෝ, යේන භගවා තෙනුපසංකමි
උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි.
එකමන්තං නිසින්නෝ ඛෝ ආයස්මා
ආනන්දෝ භගවන්තං ඒතදවෝච.

ඉක්බිති ආයුෂ්යත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතනට එළඹ
භාග්‍යවතුන් වහන්සේට වැද එකත් පස්ව උන්නාහුය එකත් පස්ව උන්
ආයුෂ්යත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ මෙසේ කීහ

ආයස්මා භන්තේ ගිරිමානන්දෝ ආබාධිකෝ දුක්ඛිතෝ
බාළ්හගිලානෝ. සාධු භන්තේ භගවා යෙනායස්මා
ගිරිමානන්දෝ තේනුපසංඛමතු අනුකම්පං උපාදායා ති.

ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිරයන් වහන්සේ ආබාධිතව දුකට පත්ව
දැඩි ලෙස ගිලන් වූයේ වෙයි භාග්‍යවතුන් වහන්ස ආයුෂ්මත් ගිරිමානන්ද යම් තැනකද
එතනට අනුකම්පා පිණිස එළඹෙනසේක් නම් මැනවි

සචේ ඛෝ ත්වං ආනන්ද! ගිරිමානන්දස්ස භික්ඛුනෝ
උපසංකමිත්වා දසසඤ්ඤා භාසෙය්‍යාසි, ඨානං ඛො පනේතං
විජ්ජති යං ගිරිමානන්දස්ස භික්ඛුනෝ දසසඤ්ඤාසුත්වා, සෝ
ආබාධෝ ඨානසෝ පටිප්පස්සම්භෙය්‍ය කතමා දස ?

ආනන්දය ඔබ ගිරිමානන්ද භික්ෂූහුගේ සමීපයට එළඹ දශසංඥාවන් කිමදැයි කියන්නේ නම්
මැනවි දශසංඥාවන් අසා ගිරිමානන්ද භික්ෂූහුගේ ඒ ආබාධය වහා සංසිදෙන්නේය
ඒ රෝග සංසිදීමට එය කාරනයක්ද වෙයි මේ දශසංඥාවන් කවරෙක් දැයි යත්

අනිච්ච සඤ්ඤා, අනත්ත සඤ්ඤා, අසුභ සඤ්ඤා,
ආදීනව සඤ්ඤා, පහාණ සඤ්ඤා, විරාග සඤ්ඤා,
නිරෝධ සඤ්ඤා, සබ්බලෝකේ අනභිරත සඤ්ඤා,
සබ්බසංඛාරේසු අනිච්ච සඤ්ඤා, ආනාපාන සති.

අනිත්‍ය සංඥා ය, අනාත්ම සංඥා ය, අසුභ සංඥා ය, ආදීනව සංඥා ය, පහාණ සංඥා ය,
විරාගසංඥා ය, නිරෝධ සංඥා ය, සියලු ලෝකයන් හි අනභිරත සංඥා ය, සියලු සංස්කාරයන්
කෙරෙහි අනිත්‍ය සංඥා ය, ආනාපාන සතිය යනුයි.

කතමාචානන්ද අනිච්චසඤ්ඤා ?

ඉධ නන්ද භික්ඛු අරඤ්ඤගතෝ වා රුක්ඛමූලගතෝ වා
සුඤ්ඤාගාරගතෝ වා ඉතිපටිසංචික්ඛති,
රූපං අනිච්චං, වේදනා අනිච්චා, සඤ්ඤා අනිච්චා,
සංඛාරා අනිච්චා, විඤ්ඤාණං අනිච්චන්ති. ඉති ඉමේසු
පඤ්චසුපාදානක්ඛන්ධේසු අනිච්චානුපස්සී විහරති.

අයං වුච්චතා නන්ද අනිච්චසඤ්ඤා.

ආනන්දය අනිත්‍ය සංඥා යනු කවරෙක්ද, මෙම සස්නෙහි මහන කෙනෙකු ආරණ්‍යගත වූයේ හෝ
රුක්ෂමූලයකට ගියේ හෝ ශූන්‍යාගාරයකට ගියේ හෝ නම් මෙසේ නුවනින් සලකා බලා රූපස්කන්දය
අනිත්‍යය, වේදනාස්කන්දය අනිත්‍යය, සංඥා ස්කන්දය අනිත්‍යය, සංකාරාස්කන්දය අනිත්‍යය,
විඥ්ඥාණස්කන්දය අනිත්‍යය යයි කියති මෙසේ මේ පංච උපාදානස්කන්ධයන් හි අනිත්‍යය ලක්ෂණය
නැවත නැවත මෙනෙහිකරමින් වෙසෙයි, ආනන්දය මේවා අනිත්‍ය සංඥා යි කියනු ලැබේ.

කතමාචානන්ද අනත්තසඤ්ඤා ?

ඉධ නන්ද භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතෝ වා
සුඤ්ඤාගාරගතෝ වා ඉති පටිසංචික්ඛති
චක්ඛුං අනත්තා, රූපා අනත්තා, සෝතං අනත්තා,
සද්දා අනත්තා, ඝාණං අනත්තා, ගන්ධා අනත්තා,
ජිව්හා අනත්තා, රසා අනත්තා, කායෝ අනත්තා,
ඵොට්ඨබ්බා අනත්තා, මනෝ අනත්තා,
ධම්මා අනත්තා ති.

ඉති ඉමේසු ඡසු අජ්ඣත්තික බාහිරේසු ආයතනේසු
අනත්තානුපස්සී විහරති.

අයං වුච්චතා නන්ද අනත්තසඤ්ඤා.

ආනන්දය අනාත්ම සංඥා යනු කවරෙක්ද, මෙම සස්නෙහි මහන කෙනෙකු ආරණ්‍යගත
වූයේ හෝ රුක්ෂමූලයකට ගියේ හෝ ශූන්‍යාගාරයකට ගියේ හෝ නම් මෙසේ නුවනින් සලකා
බලා ඇස අනාත්මය, රූපය අනාත්මය, ශබ්දයෝ අනාත්මය, නාසය අනාත්මය, ගන්ධයෝ
අනාත්මය, දිව අනාත්මය, රසය අනාත්මය, කය අනාත්මය, ස්පර්ශයෝ අනාත්මය, මනස
අනාත්මය, ධර්මයෝ අනාත්මය යි කියති. මෙසේ අධ්‍යාත්මික වූද බාහිර වූද මේ ෂඩ් ආයතනයන්
කෙරෙහි අනාත්ම ලක්ෂන දකිමින් වෙසෙයි. ආනන්දය මේවා අනාත්ම සංඥා යි කියනු ලැබේ.

කතමාචානන්ද අසුභසඤ්ඤා
ඉධ නන්ද භික්ඛු ඉමමේව කායං උද්ධං පාදතලා අධෝ
කේසමත්ථකා තච පරියන්තං පූරං නානප්පකාරස්ස
අසුචිනෝ පච්චවෙක්ඛති.

අත්ථි ඉමස්මිං කායේ, කේසා, ලෝමා, නඛා, දන්තා, තචෝ,
මංසං, නහාරු, අට්ඨී, අට්ඨිමිඤ්ජා වක්කං,
හදයං යකනං, කිලෝමකං පිහකං පප්ඵාසං,
අන්තං අන්තගුණං උදරියං කරීසං, පිත්තං සෙම්හං

පුබ්බෝ ලොහිතං සේදෝ මේදෝ, අස්සු වසා ඛේලෝ
සිඞ්ඝානිකා ලසිකා මුත්තං මත්ථකේ මත්ථලුඞ්ගංතී.

ඉති ඉමස්මිං කායේ අසුභානුපස්සී විහරති.

අයං වුච්චතා නන්ද අසුභසඤ්ඤා ?

ආනන්දය අසුභ සංඥා යනු කවරෙක්ද. ආනන්දය මෙම සස්නෙහි මහන කෙනෙකු පත්ලෙන් උඩ, කෙස් මතුයෙන් යට, සම කෙලවර කොට ඇති මේ ශරීරය නානාප්‍රකාරවූ අසූචියෙන් පිරුනේය යි ප්‍රත්‍යාවේක්ෂා කෙරේද, මේ ශරීරයේ කේසයෝ, ලෝමයෝ, නිය, දත්, සම, මස්, නහර, ඇට, ඇට මිදුලු, වකුගඩු, හෘදය, මාංශ, අක්මාව, දලබුවය, බඩදිව, පපුව, බඩවැල, අතුනුබහනය, අමු අහරය, මල ය, පිත, සෙම්, ලේ, දහඩිය, මේද, කඳුළු, තෙල්, කෙල, සොටු, මූත්‍ර යන දෑ මේ ශරීරයේ ඇත්තාහු යයිද, මෙසේ මේ ශරීරයේ ඇත්තාවූ සියල්ලන්ගේ අසුභ බව බලමින් වාසය කරයි. ආනන්දය මේවා අසුභ සංඥා යි කියනු ලැබේ.

කතමාචානන්ද ආදීනවසඤ්ඤා ?

ඉධා නන්ද භික්ඛු අරඤ්ඤගතෝ වා රුක්ඛමූලගතෝ වා සුඤ්ඤාගාරගතෝ වා  ඉතිපටිසංචික්ඛති බහුදුක්ඛෝ ඛෝ අයං කායෝ, බහු ආදීනවෝ, ඉතී ඉමස්මිං කායේ විවිධා ආබාධා උප්පජ්ජන්ති, සෙය්‍යථීදං? චක්ඛුරෝගෝ, සෝතරෝගෝ, ඝාණරෝගෝ, ජිව්හාරෝගෝ, කායරෝගෝ, සීසරෝගෝ, කණ්ණරෝගෝ, මුඛරෝගෝ, දන්තරෝගෝ, කාසෝ සාසෝ, පිනාසෝ, ඩහෝ, ජරෝ, කුච්ඡිරෝගෝ, මුච්ඡා, පක්ඛන්දිකා, සූලා, විසූචිකා, කුට්ඨං,ගණ්ඩා, කිලාසෝ, සෝසෝ, අපමාරෝ, දද්දූ කණ්ඩු, කච්ඡු, රඛසා, විතච්ඡිකා, ලොහිතපිත්තං මධුමේහෝ, අංසා පිළකා, භගන්දළා.

පිත්තසමුට්ඨානා ආබාධා, සෙම්හ සමුට්ඨානා ආබාධා, වාත සමුට්ඨානා ආබාධා, සන්නිපාතිකා ආබාධා, උතුපරිනාමජා ආබාධා, විසමපරිහාරජා ආබාධා, ඔපක්කමිකා ආබාධා, කම්මවිපාකජා ආබාධා, සීතං උණ්හං ජිඝච්ඡා පිපාසා උච්චාරෝ පස්සාවෝ ති. ඉතිං ඉමසමිං කායේ ආදීනවානුපස්සී විහරති.

අයං වුච්චතා නන්ද ආදීනවසඤ්ඤා ?

ආනන්දය ආදීනව සංඥා යනු කවරෙක්ද, මෙම සස්නෙහි මහන කෙනෙකු ආරණ්‍යගත වූයේ හෝ රුක්ෂමූලයකට ගියේ හෝ ශූන්‍යාගාරයකට ගියේ හෝ නම් මෙසේ නුවනින් සලකා බලමින් මේ ශරීරය බොහෝ දුක් ඇත්තේ වෙයි, බොහෝ ආදීනව ඇත්තේ වෙයි, මේ ශරීරය බොහෝ ආබාධයෝ උපදිත් යි සිතයි, ඒ කවරෙක්ද යත් ඇස් රෝග , සොත රෝග, කර්ණ රෝග, නාස රෝග, දිවේ ඇතිවන රෝග, කයෙහි ඇතිවන රෝග, හිසෙහි ඇතිවන රෝග, කණෙහි ඇතිවන රෝග, මුඛයෙහි ඇතිවන රෝග, දන්ත රෝග, කාස රෝග, ස්වාස රෝග, පීණ, දැවිල්ල, උණ, උදර රෝග, මූර්ජාව, අතීසාරය, ඉදිමීම, කුෂ්ඨ, ගඩු, රෝග, අපස්මාරය, දද, නිය රෝග, පිත, මදුමේහය, අංශ රෝග, පිලිකා, පිත සහ පිතෙන් ඇතිවන රෝග, සෙම සහ සෙමෙන් ඇතිවන රෝග, වාතයෙන් හටගන්නා රෝග, තුන් දොසින් වන රෝග,

සෘතු පෙරලියෙන් ඇතිවන රෝග, විෂම පරිහාරියෙන් ඇතිවන රෝග, උපක්‍රමයෙන් ඇතිවන රෝග, කර්ම විපාකයන්ගෙන් ඇතිවන රෝග, සීත, උෂ්ණ, පිපාසය, මල මූත්‍රය නිසා වන රෝග, ආදී මේ සිරුරෙහි ආදීනව අනුව බලමින් මෙසේ මේ ශරීරයේ ඇත්තාවූ සියල්ලන්ගේ ආදීනව බලමින් වාසය කරයි. ආනන්දය මේවා ආදීනව සංඥා යි කියනු ලැබේ.

## කතමාචානන්ද පහානසඤ්ඤා ?

**ඉධා නන්ද භික්ඛු උප්පන්නං කාමවිතක්කං නාධිවාසේති පජහති විනෝදේති බයන්තිකරෝති අනභාවං ගමේති, උප්පන්නං ව්‍යාපාදවිතක්කං නාධිවාසේති පජහති විනෝදේති බ්‍යන්තිකරෝති අනභාවං ගමේති, උප්පන්නං විහිංසා විතක්කං නාධිවාසේති පජහති විනෝදේති බ්‍යන්තිකරෝති අනභාවං ගමේති, උප්පන්නුප්පන්නේ පාපකේ අකුසලේධම්මේ නාධිවාසේති පජහති විනෝදේති බ්‍යන්තිකරෝති අනභාවං ගමේති.**

## අයං වුච්චතා නන්ද පහාන සඤ්ඤා

ආනන්දය පහාන සංඥා යනු කවරෙක්ද, ආනන්දය මෙම සස්නෙහි මහන කෙනෙකු උපන් කාම විතර්කය නොඉවසත් ද, අත්හරී ද, දුරු කෙරෙත් ද, නැති කෙරෙත් ද, අභාවයට පමුනවාව් ද, උපන් ව්‍යාපාද විතර්කය නොඉවසත් ද, අත්හරී ද, දුරු කෙරෙත් ද, නැති කෙරෙත් ද, අභාවයට පමුනවාව් ද, උපන්නාවූ විහිංසා විතර්කය නොඉවසත් ද, අත්හරී ද, දුරු කෙරෙත් ද, නැති කෙරෙත් ද, අභාවයට පමුනවාව් ද, උපනූපන් අකුසල ධර්මයන් පවිටු අකුසල ධර්මයන් නොඉවසත් ද, අත්හරී ද, දුරු කෙරෙත් ද, නැති කෙරෙත් ද, අභාවයට පමුනවාව් ද, ආනන්දය මේවා පහාණ සංඥා යි කියනු ලැබේ.

## කතමාචානන්ද විරාග සඤ්ඤා ?

**ඉධා නන්ද භික්ඛු අරඤ්ඤගතෝ වා රුක්ඛමූලගතෝ වා සුඤ්ඤාගාරගතෝ වා ඉතිපටිසංචික්ඛති ඒතං සන්තං ඒතං පණීතං, යදිදං සබ්බසංඛාර සමතෝ සබ්බුපධිපටිනිස්සග්ගෝ තණ්හක්ඛයෝ විරාගෝ නිබ්බාණන්ති.**

## අයංවුච්චතා නන්ද විරාග සඤ්ඤා.

ආනන්දය විරාග සංඥා යනු කවරෙක්ද. මෙම සස්නෙහි මහන කෙනෙකු ආරණ්‍යගත වූයේ හෝ රුක්ෂමූලයකට ගියේ හෝ ශුන්‍යාගාරයකට ගියේ හෝ නම් මෙසේ නුවනින් සිතයි. මේ ශාන්ත මේ ප්‍රනීත මේ සියලු සංස්කාරයන්ගේ සංසිදීම සියලු කෙලෙසුන් සන්සිදීම තෘෂ්ණාව ක්ෂයය කිරීම විරාගයට නොඇලීම නිර්වාන්ය යයි. ආනන්දය මේවා විරාග සංඥා යි කියනු ලැබේ.

## කතමාචානන්ද නිරෝධසඤ්ඤා ?

**ඉධා නන්ද භික්ඛු අරඤ්ඤගතෝ වා රුක්ඛමූලගතෝ වා සුඤ්ඤාගාරගතෝ වා ඉතිපටිසංචික්ඛති ඒතං සන්තං ඒතං පනීතං, යදිදං සබ්බසංඛාර සමතෝ සබ්බුපධී පටිනිස්සග්ගෝ තණ්හක්ඛයෝ නිරොධෝ නිබ්බාණන්ති.**

## අයංවුච්චතා නන්ද නිරෝධසඤ්ඤා.

ආනන්දය විරාග සංඥා යනු කවරෙක්ද. ආනන්දය මෙම සස්නෙහි මහන කෙනෙකු ආරණ්‍යගත වූයේ හෝ රුක්ෂමූලයකට ගියේ හෝ ශූන්‍යාගාරයකට ගියේ හෝ නම් මෙසේ නුවනින් සිතයි මේ ශාන්ත, මේ ප්‍රනීත, මේ සියලු සංස්කාරයන්ගේ සංසිඳීම කෙලෙසුන් සන්සිඳීම, තෘෂ්ණාව ක්ෂයය කිරීම, නිරෝදය නිර්වානය යයි. ආනන්දය මේවා නිරෝධ සංඥා යි කියනු ලැබේ.

කතමාචානන්ද සබ්බලෝකේ අනභිරත සඤ්ඤා ?

ඉධා නන්ද භික්ඛු යේ ලෝකේ උපායුපාදානා චේතසෝ
අධිට්ඨා නාභි නිවේසා නුසයා තේ පජහන්තෝ
විරමති න උපාදියන්තෝ.

අයං වුච්චතා නන්ද සබ්බලෝකේ අනභිරත සඤ්ඤා.

ආනන්දය මුලු ලොව නොඇලීමේ සංඥාව යනු කවරෙක්ද. ආනන්දය මෙම සස්නෙහි මහන කෙනෙකු ලෝකයෙහි උපයා ගත් යම් තෘෂ්ණා දෘෂ්ටියක් වෙත්ද, යම් උපාදානයක් වෙත්ද, සිත පිලිබඳ පිහිටියාවූ අභිනිවේසයෝ වෙත්ද, අනුසයෝ නම් පැවති කෙලෙස් වෙත්ද, ඔවුන් පහ කරමින් නො ගනිමින් නොඇලේද, ආනන්දය මේවා සියලු ලොවෙහිම අනභිරත සංඥාව යයි කියනු ලැබේ.

කතමාචානන්ද සබ්බසංකාරේසු අනිච්ච සඤ්ඤා ?

ඉධා නන්ද භික්ඛු සබ්බසංකාරේහි අටටීයති
හරායති ජිගුච්ඡති.

අයං වුච්චතා නන්ද සබ්බසංකාරේසු අනිච්ච සඤ්ඤා.

ආනන්දය සියලු සංස්කාර ධර්මයන් හී අනිත්‍ය සංඥාව යනු කවරෙක්ද. ආනන්දය මෙම සස්නෙහි මහන කෙනෙකු සියලු සංස්කාර ධර්මයන් කෙරෙන් පීඩාවට පත්වේද, ලැජ්ජාවේද, පිල්කුල් කෙරේද, ආනන්දය මෙය සියලු සංස්කාර ධර්මයන් කෙරෙහි අනිච්ච සංඥාව යයි කියනු ලැබේ.

කතමාචානන්ද ආනාපානසති ?

ඉධා නන්ද භික්ඛු අරඤ්ඤගතෝ වා රුක්ඛමූලගතෝ වා
සුඤ්ඤාගාරගතෝ වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා
උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

සෝ සතෝව අස්සසති, සතෝ පස්සසති, දීඝං වා
අස්සසන්තෝ දීඝං අස්සසාමී ති පජානාති, දීඝං වා
පස්සසන්තෝ දීඝං පස්සසාමීති පජානාති රස්සං වා
අස්සසන්තෝ රස්සං අස්සසාමී ති පජානාති; රස්සංවා
පස්සසන්තෝ රස්සං පස්සසාමී ති පජානාති; සබ්බකාය
පටිසංවෙදී  අස්සසිස්සාමී ති සික්ඛති; සබ්බකාය පටිසංවෙදී
පස්සසිස්සාමී ති සික්ඛති; පස්සම්භයං කාය සංඛාරං
අස්සසිස්සාමී ති සික්ඛති; පස්සමභයං කාය සංඛාරං
පස්සසිස්සාමී ති සික්ඛති; පීතිපටිසංවෙදී අස්සසිස්සාමී ති
සික්ඛති; පීතිපටිසංවෙදී පස්සසිස්සාමී ති සික්ඛති;
සුඛපටිසංවේදී අස්සසිස්සාමී ති සික්ඛති; සුඛපටිසංවේදී
පස්සසිස්සාමී ති සික්ඛති; චිත්තසංඛාර  පටිසංවෙදී

අස්සසිස්සාමී ති සික්ඛති; චිත්තසංඛාර පටිසංවෙදී
පස්සසිස්සාමී ති සික්ඛති; පස්සම්භයං චිත්තසංඛාරං
අස්සසිස්සාමී ති සික්ඛති; පස්සම්භයං චිත්තසංඛාරං
පස්සසිස්සාමී ති සික්ඛති; චිත්තපටිසංවේදි අස්සසිස්සාමී
ති සික්ඛති; චිත්තපටිසංවේදි පස්සසිස්සාමී ති සික්ඛති;
අභිප්පමෝදයං චිත්තං අස්සසිස්සාමී ති සික්ඛති;
අභිප්පමෝදයං චිත්තං පස්සසිස්සාමී ති සික්ඛති,
සමාදහං චිත්තං අස්සසිස්සාමී ති සික්ඛති; සමාදහං
චිත්තං පස්සසිස්සාමී ති සික්ඛති; විමෝචයං චිත්තං
අස්සසිස්සාමී ති සික්ඛති; විමෝචයං චිත්තං පස්සසිස්සාමී
ති සික්ඛති; අනිච්චානුපස්සී අස්සසිස්සාමී ති සික්ඛති;
අනිච්චානුපස්සී පස්සසිස්සාමී ති සික්ඛති; විරාගානුපස්සී
අස්සසිස්සාමී ති සික්ඛති; විරාගානුපස්සී පස්සසිස්සාමී ති
සික්ඛති; නිරෝධානුපස්සී අස්සසිස්සාමී ති සික්ඛති;
නිරෝධානුපස්ස පස්සසිස්සාමී ති සික්ඛති; පටිනිස්සග්ගානුපස්සී
අස්සසිස්සාමී ති සික්ඛති; පටිනිස්සග්ගානුපස්සී
පස්සසිස්සාමී ති සික්ඛති.

අයං වුච්චතා නන්ද ආනාපානසති.

ආනන්දය ආනාපාන සතිය යනු කවරෙක්ද, ආනන්දය මෙම සස්නෙහි මහන කෙනෙකු ආරණ්‍යගත වූයේ හෝ රුක්ෂමූලයකට ගියේ හෝ ශූන්‍යාගාරයකට ගියේ හෝ ද පලක් බැද උඩුකය ඇද නැතිව මනාව පිහිටුවාගෙන අරමුනෙහි සිහිය එළවා හිදියි ද, ඒ මහණතෙම සිහිඇත්තේමව ආශ්වාස කෙරේද, සිහිඇත්තේමව ප්‍රාශ්වාස කෙරයිද, දීර්ඝ කොට ආශ්වාස කෙරේද, දීර්ඝ කොටආශ්වාස කරන බව දනීද, දීර්ඝ කොට ප්‍රාශ්වාස කෙරේද, දීර්ඝ කොට ප්‍රාශ්වාස කරන බව දනීද, ලඝු කොට ආශ්වාස කෙරේද, ලඝු කොට ආශ්වාස කරන බව දනීද, ලඝු කොට ප්‍රාශ්වාස කෙරේද, ලඝු කොට ප්‍රාශ්වාස කරන බව දනීද, සකල ආශ්වාස කාලය මුල , මැද, අග, පහළ කරමින් ආශ්වාස කරමින් හික්මෙයි, සකල ප්‍රාශ්වාස කාලය මුල, මැද, අග, පහළ කරමින් ප්‍රාශ්වාස කරමින් හික්මෙයි.  කාය සංස්කාරහ හෙවත් ආශ්වාසය සංසිදුවන්නෙමි ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. කාය සංස්කාරහ හෙවත් ප්‍රාශ්වාසය සංසිදුවන්නෙමි ප්‍රාශ්වාස කෙරෙමි යි හික්මෙයි. ප්‍රීතිය විදිමින් ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. ප්‍රීතිය විදිමින් ප්‍රාශ්වාස කෙරෙමි යි හික්මෙයි. සුවය විදිමින් ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. සුවය විදිමින් ප්‍රාශ්වාස කෙරෙමි යි හික්මෙයි. චිත්තසංකාර විදිමින් ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. චිත්තසංකාර විදිමින් ප්‍රාශ්වාස කෙරෙමි යි හික්මෙයි. සිත දන්නේ ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. සිත දන්නේ ප්‍රාශ්වාස කෙරෙමි යි හික්මෙයි. සිත පහන් කරමින් ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. සිත පහන් කරමින් ප්‍රාශ්වාස කෙරෙමි යි හික්මෙයි. සිත අරමුණෙහි සමව තබමින් ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. සිත අරමුණෙහි සමව තබමින් ප්‍රාශ්වාස කෙරෙමි යි හික්මෙයි. නිර්වානයෙන් සිත මුදම්න් ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. නිර්වානයෙන් සිත මුදම්න් ප්‍රාශ්වාස කෙරෙමි යි හික්මෙයි. අනිත්‍යානුඅදර්ශී වූවෙමි, ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. අනිත්‍යානුඅදර්ශී වූවෙමි, ප්‍රාශ්වාස කෙරෙමි යි හික්මෙයි. විරාගානුඅදර්ශී වූවෙමි, ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. විරාගානුඅදර්ශී වූවෙමි, ප්‍රාශ්වාස කෙරෙමි යි හික්මෙයි. නිරෝධානුඅදර්ශී වූවෙමි, ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. නිරෝධානුඅදර්ශී වූවෙමි, ප්‍රාශ්වාස කෙරෙමි යි හික්මෙයි. ප්‍රතිනිඃසර්ගානු වූවෙමි, ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. ප්‍රතිනිඃසර්ගාන වූවෙමි, ප්‍රාශ්වාස කෙරෙමි යි හික්මෙයි. ආනන්දය මෙය ආනාපාන සතිය යයි කියනු ලැබේ.

සචේ ඛො ත්වං ආනන්ද ගිරිමානන්දස්ස භික්ඛුනෝ උපසංකමිත්වා ඉමා දස සඤ්ඤා භාසෙය්‍යාසි. ඨානං ඛෝ පනේ තං විජ්ජත, යං

## ගිරිමානන්දස්ස භික්ඛුනො ඉමා දස සඤ්ඤා සුත්වා සෝ ආබාධෝ ඨානසෝ පටිප්පස්සම්භෙය්‍යාති.

ආනන්දය ඔබ ගිරිමානන්ද භික්ෂූන් වෙත එළඹ, මේ දස සංඥාවන් කියන්නෙහි නම් ගිරිමානන්ද භික්ෂු තෙමේ මේ දස සංඥාවන් අසා, ඒ ආබාධයන්ගෙන් වහා සංසිඳෙන්නේය.

## අථ ඛෝ ආයස්මා ආනන්දෝ භගවතෝ සන්තිකේ ඉමා දස සඤ්ඤා උග්ගහෙත්වා යෙනායස්මා ගිරිමානන්දෝ තෙනුපසංකමි. උපසංකමිත්වා අයස්මතො ගිරිමානන්දස්ස ඉමා දස සඤ්ඤා අභාසි.

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ දස සංඥාවන් උගෙන, ආයුෂ්මත් ගිරිමානන්ද භික්ෂූන් යම් තැනකද එතනට එළඹ, ආයුෂ්මත් ගිරිමානන්ද භික්ෂු නමට මේ දස සංඥාවන් වදාළේ ය.

## අථ ඛෝ ආයස්මතෝ ගිරිමානන්දස්ස ඉමා දස සඤ්ඤා සුත්වා සෝ ආබාධෝ ඨානසෝ පටිප්පස්සම්භි. වුට්ඨාහි චායස්මා ගිරිමානන්දෝ තම්හා ආබාධා, තථා පහීනෝ ච පනායස්මතෝ ගිරිමානන්දස්ස සෝ ආබාධෝ අහෝසි ති.

ආයුෂ්මත් ගිරිමානන්ද භික්ෂූන්වහන්සේ ඒ ආබාධයෙන් නැගී සිටියේය ආයුෂ්මත් ගිරිමානන්ද තෙරුන්ගේ ඒ ආබාධය අහෝසිවී පහවී ගියේමය

# අටවිසි පිරිත

## තණ්හඞ්කරො මහා වීරො, මෙධඞ්කරො මහායසො සරණඞ්කරො ලොකහිතො, දීපඞ්කරො ජුතින්ධරො

මහා වීර වූ තණ්හඞ්කර බුදුරජානන් වහන්සේ ද, මහා යසස් ඇත්තා වූ මෙධඞ්කර බුදුරජානන් වහන්සේ ද, ලොකයට හිතවත් වූ සරණඞ්කර බුදුරජානන් වහන්සේ ද, මහත් ආලෝකයක් දෙන්නා වූ දීපඞ්කර බුදුරජානන් වහන්සේ ද,

## කොණ්ඩඤ්ඤො ජනපාමොක්ඛො, මඞ්ගලො පුරිසාසභො සුමනො සුමනො ධීරො, රේවතෝ රතිවද්ධනො

මනුශ්‍යයන්ට නිවන දෙන්නා වූ කොණ්ඩඤ්ඤ බුදුරජානන් වහන්සේ ද, මිනිසුන් අතර ශ්‍රේෂ්ඨ වූ මඞ්ගල බුදුරජානන් වහන්සේ ද, සතුටු මනසක් ඇති සුමන බුදුරජානන් වහන්සේ ද, නිවනට සිත යොමුකල රේවත බුදුරජානන් වහන්සේ ද,

## සෝභිතො ගුණ සම්පන්නො, අනෝමදස්සී ජනුත්තමො පදුමෝ ලෝක පජ්ජෝතො, නාරදො වරසාරථී

ගුණ සම්පන්න වූ සෝභිත බුදුරජානන් වහන්සේ ද, ජනයා අතර උතුම් වූ අනෝමදස්සී බුදුරජානන් වහන්සේ ද, ලෝකයට දැල්වූ පහනක් බඳු වූ පදුම බුදුරජානන් වහන්සේ ද, ලෝකයට උතුම් මග පෙන්නන්නා වූ නාරද බුදුරජානන් වහන්සේ ද,

## පදුමුත්තරෝ සත්තසාරො, සුමෙධො අග්ග පුග්ගලො සුජාතො සබ්බලොකග්ගො, පියදස්සී නරා සභො

සත්වයන්ට නිවන පෙන්නන්නා වූ පදුමුත්තර බුදුරජානන් වහන්සේ ද, මිනිසුන් අතර අග්‍ර වූ සුමේද බුදුරජානන් වහන්සේ ද, ලෝකයාට උතුම් වූ සුජාත බුදුරජානන් වහන්සේ ද, මිනිසුන් අතර ශ්‍රේෂ්ඨ වූ පියදස්සී බුදුරජානන් වහන්සේ ද,

**අත්ථදස්සී කාරුණිකො, ධම්මදස්සි තමොනුදො**
**සිද්ධත්ථො අසමො ලොකෙ,තිස්සො වරදසංවරො**

කරුණාගුණ ඇති අත්ථදස්සී බුදුරජානන් වහන්සේ ද, අඳුර දුරුකලා වූ ධම්මදස්සි බුදුරජානන් වහන්සේ ද, ලෝකයාට අසම සම වූ සිද්ධත්ථ බුදුරජානන් වහන්සේ ද, සංවර බවින් උතුම් වූ තිස්ස බුදුරජානන් වහන්සේ ද,

**ඵුස්සො වරද සම්බුද්ධො, විපස්සී ච අනූපමො**
**සිඛී සබ්බහිතො සත්ථා, වෙස්සභූ සුඛදායකෝ**

සම්බුදු බවින් උතුම් වූ ඵුස්ස බුදුරජානන් වහන්සේ ද, උපමා නොමැත්තාවූ විපස්සී බුදුරජානන් වහන්සේ ද, සියළු සත්වයින්ට හිත් ඇත්තා වූ සිඛී බුදුරජානන් වහන්සේ ද, සැප ගෙනදෙන්නාවූ වෙස්සභූ බුදුරජානන් වහන්සේ ද,

**කකුසන්ධෝ සත්ථවාහෝ, කොණාගමනෝ රණඤ්ජහෝ**
**කස්සපෝ සිරි සම්පන්නෝ, ගොතමෝ සක්‍ය පුංගවො**

සත්වයන්ට මග පෙන්නන්නාවූ කකුසන්ද බුදුරජානන් වහන්සේ ද, මාර යුද්ධයෙන් ජයගත්තාවූ කෝණාගමන බුදුරජානන් වහන්සේ ද, යහපත් ගුණයෙන් යුක්ත වූ කස්සප බුදුරජානන් වහන්සේ ද, සාක්‍ය වංශයට උතුම් වූ ගෞතම බුදුරජානන් වහන්සේ ද,

**තෙසං සච්චේන සීලෙන, ඛන්තිමෙත්ත බලේනච**
**තෙපි ත්වං අනුරක්ඛන්තු, ආරෝග්‍යෙන සුඛේනච**

ඒ බුදුරජානන් වහන්සේලාගේ සත්‍ය බලයෙන්, ශීල බලයෙන්, ශාන්ති බලයෙන්, මෛත්‍රී බලයෙන්, නීරෝගීව, සැපයෙන් යුතුව ඔබ සැම ආරක්‍ෂා වේවා.

# ජය පිරිත

**සිරි ධිති මති තේජෝ ජයසිද්ධි මහිද්ධි**
**මහා ගුණං අපරිමිත පුඤ්ඤාධිකාරස්ස**
**සබ්බන්තරාය නිවාරණ සමත්ථස්ස**
**භගවතෝ අරහතො සම්මා සම්බුද්ධස්ස**
**ද්වත්තිංස මහාපුරිසලක්ඛණානුභාවෙන**
**අසීත්‍යානුව්‍යඤ්ජන ලක්ඛණානුභාවෙන**
**අට්ඨුත්තරසත මංගල ලක්ඛාණුනුභාවෙන**
**ඡබ්බණ්ණරංස්‍යානුභාවෙන**
**කේතුමාලානුභාවෙන දසපාරමිතානුභාවෙන**
**දසඋපපාරමිතානුභාවෙන**
**දසපරමත්තපාරමිතානුභාවෙන**
**සීලසමාධිපඤ්ඤානුභාවෙන**
**බුද්ධානුභාවෙන ධම්මානුභාවෙන**
**සංඝානුභාවෙන තේජානුභාවෙන**

ශ්‍රී සෞභාග්‍ය ධෛර්‍ය්‍යය බුද්ධි තේජස් ඇත්තාවූද ජයසිරි මහා ඉර්ධි මහාගුණ ඇත්තාවූද උප්‍රමාණ පුන්‍යසම්පත්තියක් ඇත්තාවූද සකලාන්තරාය දූරීභූත කිරීමේ ශක්තිය ඇත්තාවූද

ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදුරජානන් වහන්සේගේ
දෙතිස් මහා පුරිස් ලක්‍ෂන අනුහසින්ද
අසූ අනුව්‍යඤ්ජන ලක්‍ෂන අනුහසින්ද
එකසිය අටක් මඟුල් ලක්‍ෂන අනුහසින්ද
සවනක් සණ බුදුරැස් අනුහසින්ද
කේතුමාලාවේ අනුහසින්ද
දස පාරමිතාවන්ගේ අනුහසින්ද
දස උප පාරමිතාවන්ගේ අනුහසින්ද
දස පරමාර්ථ පාරමිතාවන්ගේ
අනුහසින්ද සීල සමාධි
ප්‍රඥාවන්ගේ අනුහසින්ද
සම්බුදුරදුන්ගේ අනුහසින්ද
සදහම් බලයේ අනුහසින්ද
මහ සඟරුවනගේ අනුහසින්ද

ඉධ්‍යානුභාවෙන බලානුභාවෙන
ඤෙය්‍යධම්මානුභාවෙන චතුරාසිතිසහස්ස
ධම්මක්ඛන්ධානුභාවෙන නවලොකුත්තර
ධම්මානුභාවෙන
අට්ඨංගිකමග්ගානුභාවෙන
අට්ඨසමාපත්‍යානුභාවෙන
ඡළභිඤ්ඤානුභාවෙන මෙත්තා කරුණා
මුදිතා උපෙක්ඛානුභාවෙන
සබ්බපාරමිතානුභාවෙන
රතනත්තය සරණානුභාවෙන
තුය්හං සබ්බරෝග සෝක උපද්දව
දුක්ඛදෝමනස්සුපායාසා
විනස්සන්තු සබ්බසංකප්පා තුය්හං
සමිජ්ඣන්තු දීඝායුකෝ හෝතු සත වස්ස
ජීවෙන සමංගිකෝ හෝතු සබ්බදා
ආකාස පබ්බත වන භූමි තටාක
ගංගා මහා සමුද්ද ආරක්ඛක දේවතාසදා
තුම්හේ අනුරක්ඛන්තු සබ්බ
බුද්ධානුභාවේන සබ්බ ධම්මානුභාවේන
සබ්බ සංඝානුභාවේන බුද්ධරතනං
ධම්මරතනං සංඝරතනං තින්නං රතනානං
ආනුභාවෙන චතුරාසිති සහස්ස
ධම්මක්ඛන්ධානුභාවේන
පිටකත්තයානුභාවේන
ජිනසාවකානුභාවේන සබ්බේ තේ රොගා
සබ්බේ තේ භයා සබ්බේ තේ අන්තරායා
සබ්බේ තේ උපද්දවා සබ්බේ තේ
දුන්නිමිත්තා සබ්බේ තේ අවමංගලා
විනස්සන්තු ආයුවඩ්ඪකෝ ධනවඩ්ඪකෝ
සිරිවඩ්ඪකෝ යසවඩ්ඪකෝ
බලවඩ්ඪකෝ වණ්ණවඩ්ඪකෝ
සුඛවඩ්ඪකෝ හෝතු සබ්බදා
දුක්ඛ රෝග භයා වේරා
සෝකා සබ්බේ උපද්දවා අනේකා
අන්තරායාපි විනස්සන්තු ච තේජසා ජය
සිද්ධි ධනං ලාභං සොත්ථි භාග්‍යං සුඛං
බලං සිරි ආයු ච වණ්ණො ච භොගං
වුද්ධි ච යසවා සතවස්සා ච ආයුව ජීව
සිද්ධි භවන්තුතේ

තේජස්වල අනුහසින්ද
ආර්‍ය අෂ්ඨාංගික මාර්ගයේ
අනුහසින්ද
අටසමවත් අනුහසින්ද
ෂඩ් අභිඥාවන්ගේ අනුහසින්ද
මෛත්‍රී කරුනා මුදිතා උපේක්ෂා
ගුනයන්ගේ අනුහසින්ද
සියළු පාරමිතාවන්ගේ අනුහසින්ද
තෙරුවන් සරණේ අනුහසින්ද
මාගේ සියළු රෝගද
සියළු ශෝකයන්ද සියළු උවදුරුද
සියළු දුක් දොම්නස්ද
දුරුවේවා
මාගේ සියළු පැතුම් ඉටුවේවා
දීර්ඝායුෂ ලබා සියවසක් ජීවත්වීමේ
වාසනාව උදාවේවා
අහසද පර්වතද වන භූමි තටාකයන්ද
ගංගා හා මහා සමුද්‍රයටද
උධිගෘහිත වූ සියළු දෙවියෝ
සදා කල්හීම අප රැකදෙත්වා
සියළු බුදු බලයෙන්ද
සියළු සදහම් බලයෙන්ද
සියළු සඟසරණින්
බුදුන් දහම් සඟුන්
යන තෙරුවන් බලයෙන්ද
අසූහාර දහසක්
ධර්මස්කන්ධයේ බලයෙන්ද
තුන් පිටකයේ බලයෙන්ද
බුද්ධ ශ්‍රාවකයන්ගේ බලයෙන්ද
මාගේ සියළු රෝගද
මාගේ සියළු බියද
මාගේ සියළු අන්තරායයන්ද
මාගේ සියළු උවදුරුද
මාගේ සියළු අසුබ නිමිතිද
මාගේ සියළු අවමංගල්‍යයන්ද
විනාශ වේවා
ආයු වැඩිවේවා
ධනයේ දියුණුව වේවා
සිරිය වැඩිවේවා
යසස බලය දියුණුව වේවා
පැහැය වැඩිවේවා
සැපය තව වැඩිවේවා
නිදුක් බව වේවා
සදාකල්හිම ජයම වේවා
සියළු දුක් රෝග බිය
සෝක උවදුරු වෛරය දුරුවී
සාමය උදාවී
අනේක වූ අනතුරු දුරුවේවා
ජය ධන ලාබ
යහපත වාසනාව උදාවේවා
සැප බල සිරිය
ආයුස පැහැය වැඩිවේවා
සම්පත යසස දියුණුව
නොමදව ලබමින්
සියවස් ආයු ලබමින් ද
නිබද යෙහෙන් සැරදේවා

# මාර පරාජය පිරිත

බුද්ධං සුද්ධ ගුණාකරං දස බලං
දේවාති දේවං ජිනං ධම්මං තේන
සුදේසිතං භවනුදං දුක්ඛා පහං නිම්මලං
සංඝං චාපිනිරංගනං මුනිසුතං වන්දා මහං
මුද්ධනා බුද්ධෝ ධම්ම ගණෝ තථාගත
වරෝ පාලෙන්තු තේ මං සදා

මහී කාන්තා තොමෝ කම්පා වීමෙන්, සර්වඥයන් වහන්සේට බෝමැඩ අත්වීමෙන්, අසංඛ්‍ය අපරිමාණ වූ මාර සෙනග පලා ගියහ.

බුදුරජානන් වහන්සේට ජය අත්විය. ඒ සත්‍ය බලයෙන් මට ද උතුම් ජය මංගල්‍යයක්ම වේවා.

පඨවිබල සුන්දරී සබ්බඤ්ඤු බෝධි
මණ්ඩලං අසං බෙය්‍යං මාරසේනං
ජයෝ ජයතු මඞගලං කකුසංධෝ
කෝණාගමනෝ කස්සපෝ ගෝතමෝමුනි
මෙත්තෙයෙයෝ පඤ්ච බුද්ධා තේ සීසේ මේ
සෙන්තුසබ්බදා ඒතේසං ආනුභාවේන
යක්ඛාදේවා මහිද්ධිකා තේසබ්බේ සුඛිතා
හොන්තු මම මිත්තා සහායකා සම්බුද්ධේ

කකුසඳ කෝණාගම කාශ්‍යප ගෞතම මෛත්‍රී යන පස් බුදු පියානන් වහන්සේලා හැම කල්හී මාගේ සිරසයෙහි පිහිටත්වා.

උන් වහන්සේලාගේ ආනුභාවයෙන් මහා ඍද්ධිමත්වූ යක්ෂ දේව මනුෂ්‍යාදි සියල්ලෝම සුවපත්වෙත්වා.

මා ඔබ සැමගේ සහායකයෙකි, මිත්‍රයෙකි, ඔබ සැමද මාගේ සහායකයෝය, මිත්‍රයෝය.

අට්ඨවීසංච ද්වා දසං ච සහස්සකං
පඤ්ච සත සහස්සානි නමාමි සිරසා අහං
අප්පකා වලුකා ගංගා අනන්තා නිබ්බුතා
ජිනා තේසං ධම්මඤ් ච සංඝඤ් ච සබ්බේ
පච්චේක සම්බුද්ධෙ බෝධිරාජෙ ච
සබ්බේසං සාදරේන නමාමහං
නමස්කාරේනු භාවේන සබ්බේ භයා
උපද්ධවා අනේකා අන්තරායාපි
විනස්සංතු අසේසතෝ සුවණ්ණ භූමිං
ගනත්වාන සෝනුත්තර මහිද්ධිකෝ
පිසාචේ නිධහිත්වාන බ්‍රහ්මජාල මදේසයි
ඒතේන සච්ච වජ්ජේන
සොත්ථි මේ තේ හෝතු සබ්බදා

උටවිසි බුදුරජානන් වහන්සේලාද, පන් ලක්ෂ දොලොස් දහසක් බුදු පියානන් වහන්සේලාද, සිරස නමා වන්දනාකරමි.

කාන්තාරවල, ගංගාවල, වැලි ඇට ගනනටත් වඩා ලොව බුදුවූ අනන්තාපරිමාන බුදු පියානන් වහන්සේලාටද, උන් වහන්සේලා දේශනාකල ධර්ම රත්නයටද, සියලු ආර්ය උතුමන් වහන්සේලාටද, භක්ත්‍යාදරයෙන් මම නමස්කාර කරමි.

එසේ වන්දනා කිරීමේ ආනුභාව බලයෙන්, සියලු භය සහ උපද්‍රවයෝද, නොයෙකුත් අනතුරුද, ඉතුරු නොවී දුරුවෙත්වා.

# දස දිසා පිරිත

දිසාසු දස භාගේසු, ඨිතා බුද්ධානු භාවතෝ
වේරාපි අන්තරායා පි, විනස්සන්ති අසේසතෝ

ඒවමාදි ගුනෝ පේතං, පරිත්තං තං භණා මහේ
පදුමුත්තරෝ පුරත්ථිමායං, අග්ගිම්හි වේච රේවතෝ
දක්ඛිණේ කස්සපෝ බුද්ධෝ, නෙරුතේච සුමංගලෝ
පච්ඡමේච සිඛී බුද්ධෝ, වායව්‍යා මේධංකරෝ

උත්තරෝපියදස්සීච, ඊසානෙ දීපංකරෝ
පඨව්‍යා කකුසංධෝච, ආකාසේ සරණංකරෝ

ඒවං දසදිසාචේව, සබ්බේ බුද්ධා පතිට්ඨිතා
අච්චන්තරායා සබ්බේ තේ, සෝක රෝග භයාපිච

විනස්සන්තු සදා තුය්හං, සබ්බිරියා පඨෙසුච
යක්ඛාදි දේවතා භිච, රාජ චෝරාදි අග්ගිභි

අමනුස්සේහි සබ්බේහි, තිරච්ඡානගතේහිච
ජාතා උපද්දවා සබ්බේ, විනස්සංතු ආසේසතෝ

සිරස්මිංතේ  බුද්ධ සෙඨිධෝ, සාරිපුත්තෝච දක්ඛිනේ
වාමංසේ මොග්ගල්ලානෝ, තේ පුරතෝ පිටකත්තයං

පච්චිමේ තවආනන්දෝ, චතුස්දිසා ඛිනාසවා
සමන්තා ලෝකපාලාච, ඉන්දදේවෝච බ්‍රහ්මච

ඒතේසං ආනුභාවේන, සබ්බූ පද්ද චුපද්දවා
අනේකා අන්තරායාපි, විනස්සන්තු අසේසතෝ

# සීවලි පිරිත

පූරෙන්තා පාරමි සබ්බෙ, සබ්බෙ පච්චෙකනායකා
සීවලි ගුණතේජෙන, පරිත්තං තං භණාමහේ
නජාලිති ති ජාලිතාමි, ආ ඊ ඌ ආමි ඉ ස්වාහා
බුද්ධසාමි බුද්ධසත්‍යාමි,පදුමුත්තරො නාම ජිනෝ
සබ්බ ධම්මෙසු චක්ඛුමා, ඉතෝ සතසහස්සම්හි
කප්පෙ උප්පජ්ජි නායකෝ, සීවලි ච මහාථෙරෝ
සෝ රහෝ පච්චයාදිනං, පියෝ දේවමනුස්සානං
පියෝ බ්‍රාහ්මණ මුත්තමෝ, පියෝ නාග සුපණ්ණානං
පිණීන්ද්‍රියං නමාමහං, නාසං සීමෝ ච මේ සීසං
නානාජාලිති සඞ්ද්ජලිං,සදේව මනුස්ස පූජිතං
සබ්බෙ ලාභා භවන්තු තේ, සත්තා හං ද්වාරමූල්හෝහං
මහාදුක්ඛසමප්පිතෝ, මාතා මේ ඡන්දානේන
එවමාසි සුදුක්ඛිතා, කේසේසු ජිජ්ජමානෙසු
අරහත්තමපාපුණි, දේවා නාගා මනුස්සා ච
පච්චයානුපනෙන්තිමං, පදුමුත්තරනාමඤ්ච
විපස්සිං ච විනායකං, සංපූජයිං පමුදිතෝ
පච්චයේහි විසෙසතෝ, තතෝ තේසං විසේසේන
කම්මාන විපුලුත්තමං, ලාභං ලාභාමි සබ්බත්ථ
වනෙ ගාමෙ ජලේ ථලේ, තදා දෙවෝ පණීතේහි

මමත්ථාය මහාමති, පච්චයේහි මහාවිරෝ
සසංඝෝ ලෝකනායකෝ, උපට්ඨිතෝ මයා බුද්ධෝ
ගන්ත්වා රේවතමද්දස, තතෝ ජේතවනං ගන්ත්වා
එතදග්ගේ ඨපේසි මං, රේවතං දස්සනත්ථාය
යදා යාති විනායකෝ, තිංස භික්ඛු සහස්සේහි
සහ ලොකග්ගනායකෝ, ලාභීනං සීවලි අග්ගො
මම සිස්සේසු භික්ඛවෝ, සබ්බලෝකහිතෝ සත්ථා
කිත්තයි පරිසාසු මං, කිලේසා ඣාපිතා මය්හං
භවා සබ්බෙ සමූහතා, නාගෝව බන්ධනං ඡෙත්වා
විහරාමි අනාසවෝ, ස්වාගතං වත මේ ආසි
බුද්ධසෙට්ඨස්ස සන්තිකං, තිස්සොවිජ්ජා අනුප්පත්තෝ
කතං බුද්ධස්ස සාසනං, පටිසම්භිදා චතස්සො ච
විමොක්ඛාපි ච අට්ඨමො, ඡලභිඤ්ඤා සච්ඡිකතා
කතං බුද්ධස්ස සාසනං, බුද්ධපුත්තො මහාථෙරෝ සීවලී ජින
සාවකෝ, උග්ගතේජෝ මහාවිරො තෙජසා ජින සාසනං
රක්ඛන්තා සීල තේජෙන, ධනවන්තො යසස්සිනො, එවං
තෙජානුභාවෙන, සදා රක්ඛන්තු සීවලී, කප්පට්ඨායිති බුද්ධස්ස,
බෝධි මූලෙ නිසිදයි, මාරසෙනප්පමද්දන්තො, සදා රක්ඛන්තු සීවලී,
දස පාරමිතප්පත්තො, පබ්බජි ජින සාසනෙ, ගොතම
සක්‍යපුත්තොසි, ථෙරෙන මම සීවලි, මහා සාවකා අසීතිංසු,
පුණ්ණතෙථෙරො යසස්සි සො, භවභොගෙ අග්ග ලාභිසු, උත්තමො
තෙන සීවලි, එවං අචින්තියා බුද්ධා, බුද්ධ ධම්මා අචින්තියා,
අචින්තියේසු පසන්නානං, විපාකෝහොති අචින්තියො, තේසං
සච්චෙන සීලේන, ඛන්ති මෙත්ත බලෙන ච, තෙපි මං  අනුරක්ඛන්තු
සබ්බ දුක්ඛ විනාසනං, තේසං සච්චෙන සීලේන, ඛන්ති මෙත්ත
බලෙන ච, තෙපි මං  අනුරක්ඛන්තු, සබ්බ භය විනාසනං, තේසං
සච්චෙන සීලේන, ඛන්ති මෙත්ත බලෙන ච,
තෙපි මං  අනුරක්ඛන්තු, සබ්බ රොග විනාසනං.

## මහා ජය මඞගල ගාථා

මහා කාරුණිකෝ නාථෝ හිතාය සබ්බපාණිනං
පූරෙත්වා පාරමී සබ්බා පත්තෝ සම්බෝධිමුත්තමං
ඒතෙන සච්චවජ්ජේන හෝතු තේ ජය මංගලං

සියළු සතුනට හිතැතිවූ මහා කාරුණිකයානන් වහන්සේ, පාරමී දම් පුරා, උතුම් බුද්ධත්වය ලබාගත් සේක.
මේ සත්‍යයේ වචනයෙන් අප සැමට ජය මංගල්‍යයක් වේවා.

ජයන්තෝ බෝධියා මූලේ සක්‍යානං නන්දි වද්ධනෝ
ඒවං තුය්හං ජයෝ හෝතු ජයස්සු ජය මංගලං

සියළු සතුන්ගේ සිත් සතන් සනසමින් අප මහා බෝසතානෝ ශ්‍රී මහා බෝ සමිදු පා මුල මාර සේනා ජයගත් සේක. අපටද නියත ජය ලැබේවා. අපටද ජය මංගල්‍යයක්ම වේවා.

සක්කත්වා බුද්ධරතනං ඕසධං උත්තමං වරං
හිතං දේව මනුස්සානං බුද්ධ තේජේන සොත්ථිනා
නස්සන්තුපද්දවා සබ්බේ දුක්ඛා වූපසමෙන්තු තේ

සියළු දෙව් මිනිසුන්ගේ හිත සුව සහනය පිනිස වූ ඖෂධයකට සමවූ, බුදුවරුන්ගේ බුද්ධ ගුණයෙන් අප සැමගේ සියළු දුක් නැසේවා. සියළු දුක් දුරුවේවා.

සක්කත්වා ධම්මරතනං ඕසධං උත්තමං වරං
පරිළාහූපසමනං ධම්මතේජේන සොත්ථිනා
නස්සන්තුපද්දවා සබ්බේ භයාවූපසමෙන්තු තේ

සියළු දුක් වේදනා සංසිඳුවන උතුම් වූ ඖෂධයකට සමවූ, සම්මා සම්බුදු දහමේ බලයෙන් අප සැමගේ ඇතිවන සියළු භය නැසේවා. සියළු බිය දුරුවේවා.

සක්කත්වා සංඝරතනං ඕසධං උත්තමං වරං
ආහුණෙය්‍යං පාහුණෙය්‍යං සංඝ තේජේන සොත්ථිනා
නස්සන්තුපද්දවා සබ්බේ රෝගා වූපසමෙන්තු තේ

පින් කෙතක් බඳු වූ උතුම් වූ ඖෂධයකට සමවන දුර සිට ගෙන එනු ලබන දහම් පඬුරු, දන් පිළිගැනීමට සුදුසු වූ මහා සංඝරත්නයේ බලයෙන් අප සැමගේ ඇතිවන සියළු රෝග උවදුරු නැසේවා.

යං කිඤ්චි රතනං ලෝකේ විජ්ජති විවිධා පුථු
රතනං බුද්ධ සමං නත්ථි තස්මා සොත්ථි භවන්තු තේ

ලෙවෙ ඇති අනේක වූ රුවන් අතරින් බුදුරුවනට සම වෙනත් රුවනක් නැත්තේමය. ඒ බුදුරුවනේ බලයෙන් අපහට සුව සෙත ලැබේවා.

යං කිඤ්චි රතනං ලෝකේ විජ්ජති විවිධා පුථු
රතනං ධම්ම සමං නත්ථි තස්මා සොත්ථි භවන්තු තේ

ලෙවෙ ඇති අනේක වූ රුවන් අතරින් සඟරුවනට සම වෙනත් රුවනක් නැත්තේමය. ඒ සඟරුවනේ බලයෙන් අපහට සුව සෙත ලැබේවා.

යං කිඤ්චි රතනං ලෝකේ විජ්ජති විවිධා පුථු
රතනං සංඝ සමං නත්ථි තස්මා සොත්ථි භවන්තු තේ

ලෙවෙ ඇති අනේක වූ රුවන් අතරින් දම්රුවනට සම වෙනත් රුවනක් නැත්තේමය. ඒ දම්රුවනේ බලයෙන් අපහට සුව සෙත ලැබේවා.

නත්ථි මේ සරණං අඤ්ඤං බුද්ධෝ මේ සරණං වරං
ඒතේන සච්ච වජ්ජේන හෝතු තේ ජයමංගලං

මා හට බුදුසරණ මිස අන් සරණක් නොමැත. මේ සැබෑ වදනින් අපසැමට ජය මංගල්‍යයක් වේවා.

නත්ථි මේ සරණං අඤ්ඤං ධම්මෝ මේ සරණං වරං
ඒතේන සච්ච වජ්ජේන හෝතු තේ ජයමංගලං

මා හට දහම් සරණ මිස අන් සරණක් නොමැත. මේ සැබෑ වදනින් අපසැමට ජය මංගල්‍යයක් වේවා.

නත්ථි මේ සරණං අඤ්ඤං සංඝෝ මේ සරණං වරං
ඒතේන සච්ච වජ්ජේන හෝතු තේ ජයමංගලං

මා හට සඟ සරණ මිස අන් සරණක් නොමැත. මේ සැබෑ වදනින් අපසැමට ජය මංගල්‍යයක් වේවා.

සබ්බීතියො විවජ්ජන්තු සබ්බ රෝගෝ විනස්සතු
මා තේ භවත්වන්තරායෝ සුඛී දීඝායුකො භව

සියළු උවදුරු දුරුවේවා. සියළු රෝග නැතිවේවා. කිසිදු ආන්තරායක් නොමවේවා. දීඝආයුස ලැබේවා.

භවතු සබ්බ මංගලං රක්ඛන්තු සබ්බදේවතා
සබ්බ බුද්ධානුභාවේන සදා සොත්ථි භවන්තු තේ

සියළු බුදු බලයෙන් සියළු දෙවියෝ රැකදෙවත්වා. ඒ සියළු බලයෙන් අපට සදා සුවසෙත අත්වේවා.

භවතු සබ්බ මංගලං රක්ඛන්තු සබ්බදේවතා
සබ්බ ධම්මානුභාවේන සදා සොත්ථි භවන්තු තේ

සියළු දහම් බලයෙන් සියළු දෙවියෝ රැකදෙවත්වා. ඒ සියළු බලයෙන් අපට සදා සුවසෙත අත්වේවා.

භවතු සබ්බ මංගලං රක්ඛන්තු සබ්බදේවතා
සබ්බ සංඝානුභාවේන සදා සොත්ථි භවන්තු තේ

සියළු සඟ බලයෙන් සියළු දෙවියෝ රැකදෙවත්වා. ඒ සියළු බලයෙන් අපට සදා සුවසෙත අත්වේවා.

නක්ඛත්ත යක්ඛ භූතානංපාපග්ගහ නිවාරණා
පරිත්තස්සානුභාවේන හන්තු තේසං උපද්දවේ

නැකැත් වලින්, ග්‍රහ අපල වලින්, සිදුවන සියළු උවදුරු මේ පිරිතේ අණුහසින් දුරුවේවා.

යන්දුන්නිමිත්තං අවමංගලඤ්ච, යෝචා මනාපෝ සකුනස්ස සද්දෝ
පාපග්ගහෝ දුස්සුපිනං අකන්තං, බුද්ධානුභාවේන විනාසමෙන්තු

යන්දුන්නිමිත්තං අවමංගලඤ්ච, යෝචා මනාපෝ සකුනස්ස සද්දෝ
පාපග්ගහෝ දුස්සුපිනං අකන්තං, ධම්මානුභාවේන විනාසමෙන්තු

යන්දුන්නිමිත්තං අවමංගලඤ්ච, යෝචා මනාපෝ සකුනස්ස සද්දෝ
පාපග්ගහෝ දුස්සුපිනං අකන්තං, සංඝානුභාවේන විනාසමෙන්තු

සබ්බේ බුද්ධා බලප්පත්තා පච්චේකානඤ්ච යං බලං
අරහන්තානඤ්ච තේජේන රක්ඛං බන්ධාමි සබ්බසෝ

සියළු බුදුවරුන්ගේ බලයෙන් සියළු පසේ බුදුවරුන්ගේ ශක්තියෙන් සියළු රහතුන්වහන්සේලාගේ
තේජසින් ඔබසැම ආරක්ෂාවේවා.

දේවෝ වස්සතු කාලේන සස්ස සම්පත්ති හෝතු ච
පීතෝ භවතු ලෝකෝච රාජා භවතු ධම්මිකො

කලට වැසි වසීවා, භවබෝග සම්පත් ලැබේවා, සියළු සත්වයන් භීතියෙන් මිදේවා,
රජවරු දැහැමින් රජ්‍ය පාලනය කරත්වා.

## දෙවියන්ට පින්දීම

එත්තාවතා ච අම්හේහි, සම්භතං පුඤ්ඤසම්පදං
සබ්බේ දේවා අනුමෝදන්තු, සබ්බසම්පත්ති සිද්ධියා

අප විසින් මෙසේ රැස්කරගන්නා ලද පුණ්‍ය සම්පත්, සියලු සම්පත් හි අභිවෘද්ධිය සඳහා
සියලු දෙවියෝ වෙත අනුමෝදන් වෙත්වා.

එත්තාවතා ච අම්හේහි, සම්භතං පුඤ්ඤසම්පදං
සබ්බේ භූතා අනුමෝදන්තු, සබ්බසම්පත්ති සිද්ධියා

අප විසින් මෙසේ රැස්කරගන්නා ලද පුණ්‍ය සම්පත්, සියලු සම්පත් හි අභිවෘද්ධිය සඳහා
සියලු භූතයෝ වෙත අනුමෝදන් වෙත්වා.

එත්තාවතා ච අම්හේහි, සම්භතං පුඤ්ඤසම්පදං
සබ්බේ සත්තා අනුමෝදන්තු, සබ්බසම්පත්ති සිද්ධියා

අප විසින් මෙසේ රැස්කරගන්නා ලද පුණ්‍ය සම්පත්, සියලු සම්පත් හි අභිවෘද්ධිය සඳහා
සියලු සත්වයෝ වෙත අනුමෝදන් වෙත්වා.

ආකාසට්ඨාච භුම්මට්ඨා, දේවානාගා මහිද්ධිකා
පුඤ්ඤංතං අනුමෝදිත්වා, චිරං රක්ඛන්තු ලෝක සාසනං

ආකාසට්ඨාච භුම්මට්ඨා, දේවානාගා මහිද්ධිකා
පුඤ්ඤංතං අනුමෝදිත්වා, චිරං රක්ඛන්තු දේසනං

ආකාසට්ඨාච භුම්මට්ඨා, දේවානාගා මහිද්ධිකා
පුඤ්ඤංතං අනුමෝදිත්වා, චිරං රක්ඛන්තු මං පරං

අහසෙහි වසන්නා වූද, පොළොවෙහි වසන්නා වූද, මහත් සෘද්ධි ඇති දෙවියෝ ද, නාගයෝ ද මේ පින්
අනුමෝදන්ව නිරතුරුව ලෝකයත් සාසණයත් බොහෝ කල් යහතින් ආරක්‍ෂා කරත්වා.

## තෙරුවන් සමාකර ගැනීම

කායේන වාචා චිත්තේන පමාදේන මයා කතං
අච්චයං ඛම මේ භන්තේ භූරිපඤ්ඤ තථාගත

ම විසින් සිතින් හෝ කයින් හෝ වචනයෙන් හෝ යන තුන් දොරින් නොදැනුවත්ව සිදුකරන ලද යම්
වරදක් වේ නම්, ඒ වරදට බුදුරජාණන් වහන්ස මට සමාව දෙන සේක්වා.

## කායේන වාචා චිත්තේන පමාදේන මයා කතං
## අච්චයං ඛම මේ ධම්ම සන්දිට්ඨික අකාලික

ම විසින් සිතින් හෝ කයින් හෝ වචනයෙන් හෝ යන තුන් දොරින් නොදැනුවත්ව සිදුකරන ලද යම් වරදක් වේ නම්, ඒ වරදට සන්දිට්ඨික වූ අකාලික වූ ධර්මරත්නය මට සමාව දෙන සේක්වා.

## කායේන වාචා චිත්තේන පමාදේන මයා කතං
## අච්චයං ඛම මේ සංඝ පුඤ්ඤකෙත්තං අනුත්ථරං

ම විසින් සිතින් හෝ කයින් හෝ වචනයෙන් හෝ යන තුන් දොරින් නොදැනුවත්ව සිදුකරන ලද යම් වරදක් වේ නම්, ඒ වරදට පිං කෙතක් බඳු වූ අෂ්ටාර්ය පුද්ගල මහා සංඝරත්නය මට සමාව දෙන සේක්වා.

## ඉමිනා පුඤ්ඤකම්මේන මා මේ බාලසමාගමෝ
## සතං සමාගමෝ හෝතු යාව නිබ්බාණ පත්තියා

මෙසේ කරන ලද සියලු පුණ්‍ය කර්මයන්ගේ හේතුවෙන් නිවන් දක්නා ජාති දක්වා අසත්පුරුෂ, අනුවන, බාල, ඇසුරක් නොමවේවා යහපත් උතුම් සත් පුරුෂ ඇසුරක්ම වේවා.

## ප්‍රාර්ථනා ගාථා

උතුම් බුදු බණ නිරන්තරයෙන් දෙසූ දළදා සමිඳු සරණයි
නුවන් සනහන කැළණි මියුගුණ සෑරදුන් සිලුමිණෙහි සරණයි
සමන් ගිරහිස පහන් කරමින් තැබූ මුණිසිරිපතුලෙ සරණයි
නිවන් දක්නා ජාති දක්වා අප හැමට තුණුරුවන් සරණයි

ගෙයින් පිටවී නැවත එනතුරු අපට මුණිගුණ පිහිට වේවා
කරන්නට යන සියලු කටයුතු සිතන අයුරින් සඵල වේවා
මෙයින් මතු කරදරද උවදුරු අපේ දිවියට අත් නොවේවා
බුදුන් දම් සඟරුවන් බලයෙන් සදාකල්හිම අප රකීවා


පානදුර ගොරකාන දූව පාරේ පදිංචි
හේමා මුතුමිණිතිලක මැතිනියගේ
සාශනික මෙහෙවරට තුටු පඬුරක් වශයේන්
සියළු ලෝ වාසීන්ට නීරෝගී සුව ප්‍රාර්ථනා කරමින්,
දහම් පඬුරක් ලෙස, හිතමිත්‍රාදීන් විසින්
මුද්‍රණය කරවන ලදී.

★

පලමු මුදුණය - බුද්ධ වර්ෂ 2552 වෙසක් මස 19 වන, වෙසක් පුණ්පොහෝ දින.
දෙවන මුදුණය - බුද්ධ වර්ෂ 2553 නිකිනි මස 22 වන දින.